# තිස්මඩ මිනිමැරුම

අසේල මෙන්ඩිස්

# පෙරවදන

1971 වසරේ සිදුවූ තිස්මඩ සෝමලතා මුණසිංහ නමැති තරුණියගේ ඝාතනය එකළ බොහෝ දෙනෙකු කම්පාවට පත් කල සිද්ධියක් විය. ඒ වනවිට 1971 වසරේ ඇතිවූ රාජ්‍ය විරෝධී කැරැල්ලේ උණුසුමවත් පහව ගොස් නොතිබිණි. කැරලි සමයේ සිදුවූ කතරගම රූමතිය නොහොත් ප්‍රේමවතී මනම්පේරි තරුණිය ඝාතනයද බොහෝ දෙනෙකුගේ මතකයේ තිබුණු වකවානුවක්ද විය.

උතුරු - නැගෙනහිර සන්නද්ධ ගැටුම් ඇති වීමටත් 71 අප්‍රේල් කැරැල්ලටත් 88-89 යේ කළු ජූලිය හා භීෂණ සමයටත් පෙර නිතර නිතර මනුෂ්‍ය ඝාතන අසන්නට දකින්නට නොවූ සමාජ ක්‍රමයක් අපේ රට තුළ පැවතිණි. වියපත් ව ජීවිතයේ කෙළවරට පැමිණි අයකුගේ මරණයක් හැර හෘදයාබාධයකින්, සර්ප දෂ්ටයකින් හෝ එවැනි උවදුරකින් මිය යන අයෙකු ගැන මිස හදිසි මනුෂ්‍ය ඝාතන සිදු වූයේ අල්ප වශයෙනි. කල් යත්ම සංකීර්ණ වූ සමාජයේ අපරාධ වර්ධනය විය. 1951 වසරේ සිදු වූ රෙජිනා සතාසිවම් ඝාතනය, වංගෙඩියේ මිනීමැරුම නමින් මාධ්‍යයෙන් ප්‍රකට විය. ඉන් අනතුරුව කැලැත්තෑවේ ඝාතනය, ගෝඨාභය කිරඹකන්ද මිනීමැරුම තිස්මඩ මිනීමැරුම ජීවිතයක් බිලි ගත් හාර ලක්ෂයේ මංකොල්ලය හෝකන්දර සමූහ මිනීමැරීම් ආදිය පුවත් මවන්නට සමත් විය.

1971 කැරැල්ල නිසා රට තුළ ඇතිවී තිබූ නොසන්සුන්තාවය මෙම සිද්ධිය වනවිටත් සංසිඳී නොතිබුණ නමුත් ඒ සියල්ලම මොහොතකට හෝ අමතක කරලීමට මෙම ඝාතනය සමත් විය. මෙම අපරාධය විමර්ශනය කිරීමේ මුල් අවස්ථාවේ පොලීසිය යම් අපහසු තාවයකට පත් වූවද ඉන්පසු ඝාතකයින් සොයාගැනීම සහ ඔවුන් නීතිය හමුවට ගෙනයෑමේදී එතරම් අපහසුතාවයකට පත්වන්නට ඔවුන්ට සිදුවූයේ නැත. අධිකරණ වෛද්‍ය පරීක්ෂණයෙන් පසු විශේෂයෙන්ම පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු පොලීසිය වෙත ලැබුණු සමහර අධිකරණ

විද්‍යාත්මක කරුණු ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා ඉමහත් පිටිවහලක් විය.

තිස්මඩ මිනිමැරුම ගැන කියවන විට අධිකරණ වෛද්‍ය නිරීක්ෂණ සහ නිගමන ගැන මෙන්ම සමාජයේ විවිධ පුද්ගලයන් සිතන පතන ආකාරය ගැනද මනා අවබෝධයක් ලබා ගැනීමට හැක.

මෙම කතාව කියවන්නා මනුෂ්‍ය ඝාතන මෙන්ම ඒවා විමර්ශනය කරන ආකාරයද, අධිකරණ වෛද්‍ය විද්‍යාත්මක කරුණුද මෙන්ම සමාජයේ විවිධ පුද්ගලයන් සිතන පතන හැටි සහ ක්‍රියාකරන ආකාරය ගැනද යම් කිසි අවබෝධයක් ලබා ගනී යයි මම බලාපොරොත්තු වෙමි.

අසේල මෙන්ඩිස්

## පටුන


1. බෝගම්බර සිපිරි ගෙදර
2. වෙද ගෙදර
3. සෝමලතා
4. අතුරුදහන් වීම
5. මරණ පරීක්ෂණය
6. සේනපාල
7. දඬුවම

# 1 බෝගම්බර සිපිරි ගෙදර

**මල්ලියෙ නරක මිතුරන් පිළිගන්න එපා**

**නංගියෙ නොහොබිනාකම් හුරු වෙන්න එපා**

**බෝගම්බර සිපිරි ගෙදරට එන්න එපා**

**හතුරෙකුටවත් මට වන් දුක වෙන්න එපා**

කලකට පෙර විශාරද සුනිල් එදිරිසිංහයන් මෙසේ ගැයුවේය. මහාචාර්ය සුනිල් අරියරත්නයන් විසින් රචිත මෙම ගීතය බෝගම්බර සිපිරි ගෙදර ඇති දුක මොනවට විහිදා පායි. පෝරකයට නියමවූ සිරකරුවෙකුගේ සිත තුළ තම අවසාන මොහොතේ ජනිත වන සිතුවිළි ඉතාමත් ළගන්නා ආකාරයෙන් මෙහි ඉදිරිපත් කර ඇත.

සිපිරි ගෙදර සිටින සෑම සිරකරුවෙකුටම මෙසේ යථාර්තය තේරුම් ගැනීමේ හැකියාව ඇතිදැයි මම නොදන්නෙමි. සුනිල් ආරියරත්නයන් තම ගීත රචනය සඳහා බෝගම්බර හිරගෙදරම යොදා ගත්තේ මන්දැයි මම නොදනින නමුත් ලංකාවේ ඇති සිපිරිගෙවල් අතුරෙන් ඉතාම සුවිශේෂිවූත් සුදුසුවූත් සිපිරි ගෙදර තම නිර්මාණය සඳහා යොදාගෙන ඇති බව මම සිතමි. ඓතිහාසික මහනුවර නගරයේ ඉතිහාසය හා බැඳී ඇති සිද්ධීන් ගණනාවක බෝගම්බර සහ බෝගම්බර සිපිරි ගෙදර ගැන සඳහන්වේ.

බෝගම්බර ක්‍රීඩා පිටිය ඉංග්‍රීසින් විසින් තනා විවෘත කරනු ලැබුවේ 1887 වසරේදීය. ඊට පෙර එහි තිබී ඇත්තේ ඓතිහාසික බෝගම්බර වැවයි. ලංකාවේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ විසින් ඇහැළේපොල කුමාරිහාමිව ගිල්වා මරා

දමන්නේ මෙම බෝගම්බර වැවෙහිය. ඓතිහාසික වාර්ථාවල සඳන් පරිදි ඇගේ සිරුර මතුවූවායයි සැළකෙන්නේ දැනට බෝගම්බර සිපිරි ගෙදර ගොඩනැගිල්ල ආසන්නයේ තිබෙන බෝ ගසට නුදුරෙන් වූ තැනකය. එම තොරතුරු අනුව ඉංග්‍රීසින් විසින් 1852 තනන ලද මෙම සිපිරිගෙය තිබී ඇත්තේ බෝගම්බර වැව් තාවුල්ලට ආසන්නයේය.

බෝගම්බර බන්ධනාගාරය මේ වන විට වසර එකසිය හැටක පමණ ස්මරණයකට හිමිකම් කියයි. හීල්පැන්කඳුර උල්පතින් හා දුනුමඩලාව ඔයෙහි ජල මූලාශ්‍රවලින් පෝෂණය ලබමින් මහා ජල කඳක් දරා වුන් බෝගම්බර වැව් ඉහත්තෑවේ ඉංග්‍රීසින් විසින් බෝගම්බර සිපිරි ගෙදර තැනවූහ. බෝගම්බර වැව පිහිටි භූමියේ ඉදිකෙරුණු කිසිඳු තැනකින් වෙන් නොවුනු, එකම තනි පදනමක් මත ආසියාවේ ඉදි වූ දිගම ගොඩනැගිල ලෙසත්,අක්කර 13ක තරම් භූමි ප්‍රමාණයක ව්‍යාප්ත වී ඇති සිරකරුවන් 408ක් පමණ රඳවා තැබිය හැකි බන්ධනාගාරයක් වශයෙන් ද ලංකාව තුල මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කල බන්ධනාගාර දෙකෙන් එකක් ලෙසද බෝගම්බර සිර ගෙය ප්‍රසිද්ධ නම් උසුලයි.

ශ්‍රී ලංකාව තුළ අවසාන වරට මරණ දඬුවම ක්‍රියාත්මක වූයේ 1976 වසරේදීය. එහිදී වැළිකඩ හිර ගෙදරදී 1076 ජූළි 23 වනදා හොඳ පපුවා හෙවත් ජේ. ඒ. චන්ද්‍රදාස යන අයව එල්ලා මරා දැම්ණි. බෝගම්බර සිපිරි ගෙය තුළ අවසාන වතාවට මරණ දණ්ඩනයට පමුණුවන්නේ පී. එම්. ජයවර්ධන නමැති පුද්ගලයෙකුයි. ඒ වර්ෂ 1975 නොවැම්බර් මස 22 වනදාය. එම ඝාතනයේ ප්‍රධාන චූදිතයාවූ ඩබ්.ඩී. රිචර්ඩ් නමැති අය ඊට පෙර දින බෝගම්බර සිපිරි ගෙදරදී එල්ලා මරණයට පත් කරන ලදී.

ඔවුන්ට මරණ දණ්ඩනය නියම වූයේ 1971 වසරේ ජූනි මස 25 වන දින ඝාතනය කෙරුණු සෝමලතා මුණසිංහ නමැති 28 හැවිරිදි යුවතියගෙ ඝාතනයට හවුල්වූ නිසාවෙනි. සෝමලතා ඝාතනය අදින් වසර 50කට පෙරසිදුවූ ඇසූ ඇසුවන් ගේ සිත්

කම්පාවට පත් කළ ඝාතනයක් විය. මේ කාලයේ මනුෂ්‍ය ඝාතන එතරම් සුලභ නොවූවත් මිනිස් සිත් සතන් කම්පාවට පත් කරන්නට අදටත් ප්‍රසිද්ධ සමත් ඝාතන කිහිපයක්ම සිදුවූ කාලයක් විය. සෝමලතාගේ ඝාතනය විසඳීමට අපහසු ගණයේ එකක් නොවූවත් එය සිදු කර තිබූ කුරිරු ආකාරය නිසා බොහෝ දෙනෙකුගේ අවධානයට පාත්‍රවූ ඝාතනයක් විය.

## 2 වෙද ගෙදර

සෝමලතාගේ නිවෙසට වෙද ගෙදර යැයි නම පටබැඳුනේ ඇගේ පියාවූ අල්විස් වෙද මහතා නිසාය. ඔහු පාරම්පරික සැබෑ සිංහල වෙද පරපුරක සාමාජිකයෙක් විය. අල්විස් වෙද මහතා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කරුණාවන්ත පරහිතකාමී වෙදැදුරෙක් විය. ඔහුගේ නිවස සෑම විටම රෝගීන්ට විවෘතව පැවතින. එහෙත් හෙතෙම කිසි විටකත් මුදල් අපේක්ෂාවෙන් රෝගීන්ට ප්‍රතිකාර නොකළේය. සුවවූ රෝගියෙක් ස්ව කැමැත්තෙන් මොනයම් මුදලක් සිත සතුටෙන් භාර ගත්තේය. එබැවින් ඔහු කිසිසේත්ම ධනවතෙක් නොවීය. යන්තමින් එදා වේල සරි කරගත් ගැමියෙක්ම පමණක් විය.

අල්විස් වෙද මහතා තුළ අහස උසට බලාපොරොත්තු තිබුණේ නැත. එහෙත් පවුලේ වැඩිමහල් දරුවා වූ සෝමලතා ගැන නම් මදක් වැඩියෙන් බලාපොරොත්තු විය. 1971 ජූනි මාසය වන විට ඒ බලාපොරොත්තු යම් දුරකට හෝ සපල වන බවක් පෙනෙන්නට තිබුණි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය නිමවා උපාධිධාරිණියක ලෙස ගමට පැමිණි සෝමලත ගැන නම් අහස උසටත් වඩා බලාපොරොත්තු අල්විස් වෙද මහතා තුල විය.

සෝමලතා මේ වනවිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ මුල් විභාගයට පෙනී සිට එහි ප්‍රතිපල බලාපොරොත්තුවෙන් පසුවූවාය. එහෙත් අම ප්‍රතිපල තම දෑසින් දකින්නට තරම් ඇයට වාසනාවක් නොමැති විය. දෙමව්පියන් ඈ කෙරෙහි අහස උසට තබා තිබූ බලාපොරොත්තු එක් මූසල දවසක ක්ෂණයකින් සුණු විසුණු වෙ ගියඉය.

එම අපරාධයට ප්‍රධාන වශයෙන් දායකවූ රිචර්ඩ් පදිංචිව සිටියේ වෙද මහතාගේ නිවසට මඳ දුරක් එපිටිනි.රිචර්ඩ් අඩි පහයි අඟල් හයක් පමණ උසකින් යුතු මදක් තද ඡවි වර්නයකින් යුතු පුද්ගලයෙක් විය. ඝනට වැඩුනු උඩු රැවුල දෙපසින් උඩට අතට කරකවා තිබූ බැවින් ඔහුගේ මුහුණට මැරවර පෙනුමක් එක්වී තිබුනි. එම මැරවර ගතිය ඔහුගේ

පෙනුමේ පමණක් නොව ක්‍රියාවලද තිබූ බව එදවස තිස්මඩ විසූ බොහෝ දෙනෙක් දැන සිටියහ. එමෙන්ම ඔහුගේ දාමරික කම් වලට එරෙහිව නැගී සිටීමට තරම් ධෛර්යවන්ත කිසිවෙකුත් තිස්මඩ සිටියේද නැත.

ඔහු වෙදමහතා සමඟ අමනාපයෙන් පසුවිය. මුලදී මෙයට හේතුවී තිබුණේ ඉඩම් ආරවුලකි. ඒ සම්බන්ධයෙන් නුවර උසාවියේ සිවිල් නඩුවක් පැවති අතර රිචර්ඩ් සිටියේ ඒ ගැන තරහිනි. මේ අතර දිනක අල්විස් වෙද මහතා සතු ලයිසන් තුවක්කුව නැතිවිය. අල්විස් වෙද මහතාගේ සිතෙහි මේ සම්බන්ධයෙන් රිචර්ඩ් ගැන සැකයක් තිබූ නමුත් ඔහු ඒ ගැන කිසිවෙකුට පැවසූයේ නැත. එහෙත් තුවක්කුව නැතිවෙම සම්බන්ධයෙන් ඔහු කඩුගන්නාව පොලීසියට පැමිණිල්ලක් කළේය. වහා ක්‍රියාත්මක වූ පොලීසිය මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවත්වූයේය. අවසානයේදී රිචර්ඩ් සන්තකයේ තිබී තුවක්කුව හමුවූ අතර පොලීසිය ඔහුට විරුද්ධව නඩු පැවරුවේය. එයින් සිදුවූයේ රිචර්ඩ් වෙද මහතා සමඟ තිබූ අමනාපය තවත් වැඩි වීමය.

ප්‍රේමදාස යනු රිචර්ඩ්ගේ බාල සොහොයුරා විය. ඔහුද නිත්‍ය රැකියාවක් නොකල අතර රිචර්ඩ් මෙන්ම විවිධ දේවල් කරමින් මුදල් උපයා ගත්තේය. ජයවර්ධන රිචර්ඩ්ට දුරින් නෑ කමක් තිබූ කෙනෙක් විය. ඔහුත් නිතරම රිචර්ඩ් සමඟම ගැවසුණු පුද්ගලයෙකු විය. මේ තිදෙනාගේම ක්‍රියා කලාපය ගැන වැඩි පැහැදීමක් අනෙකුත් ගම්වැසියන් තුල තිබුණේ නැත.

අල්විස් වෙද මහතා සමඟ වූ වෛරය පිරිමසාගැනීමට අවස්ථාවක් එනතුරු රිචර්ඩ් කල්මැරීය. ඔහු නිතරම කල්පනා කලේ කුමන ක්‍රමයකින් තම පළිගැනීමේ චේතනාව මුදුන් පත්කර ගන්නේද කියාය. වෙද මහතාගෙන් කෙළින්ම පළිගන්නවාට වඩා ඔහුගේ පවුලේ කෙනෙකුගෙන් තම වෛරය පිරිමසා ගැනීම ලෙහෙසි බව රිචර්ඩ්ට තේරුම් ගියේය. සෝමලතා මේ සඳහා වඩාත් සුදුසු බව ඔහුට වැටහිනි. අල්විස් වෙද මහතා සෝමලතා කෙරෙහි දක්වන අසීමිත

ආදරය නිසා එමඟින් ස්වෙද මහතාට රිදවීම පහසු බවද ඔහු තෙරුම් ගත්තේය.සෝමලතාගේ දින චාර්යාවද මේ සඳහා හොඳින්ම ගැළපීම ඇයගේ අවාසනාව විය.

# 3. සෝමලතා

තිස්මඩ කඩුගන්නාව පොලිස් වසමට අයත්වූ පිටිසර ගම්මානයකි. එක්දහස් නමසිය හැත්තෑ එක වසර කාලවකවානුවේ එහි විසුවෝ බොහෝ විට එකම කුලයකට අයත් පිරිසක්වූහ. තැනින් තැන විසිරුනු නිවෙස් වලින් සැදුම් ගත් ගම අද ඔබ දකින තිස්මඩ ග්‍රාමයට වඩා බොහෝ සෙයින් වෙනස් වූවකි. එහි විසූවන් එකිනෙකා හොඳින් හඳුනන පිරිසක් වූ අතර එය එසේ වූයේ ඔවුන් බොහෝ දෙනෙක් අතර ඥාති සම්බන්ධතාවයන්වූ බැවිනුත් එසේ නැති විට එකිනෙකා බොහෝ කාලයක් එකම ගම්මානයේ වාසය කළ නිසාත් විය. තිස්මඩ ගෙවන දිවිය දුෂ්කර එකක් වූවත් එය සැබැවින්ම සාමකාමී එකක් විය. මෙයින් අදහස් වන්නේ නිවෙස්වල ඇතිවන සුළු අඩ දබර සහ වෙනත් පවුල් ආරවුල් නොතිබුණා යන්න නොවේ. නමුත් එම ආරවුල් පොලීසිය හෝ උසාවි වෙත යොමුවෙන සුළු ආරවුල් නොවීය. මේ කාරණා කෙසේ වෙතත් යමෙකුගේ සිත තුල පවතින අදහස්, ක්‍රෝධය සහ හිංසාකාරී සිතුවිලි ගැන කිසිවෙකුටත් අනාවැකි පල කළ නොහැකි බවද අපි දනිමු. මේ ඛේදවාචකයට හේතු වූයේද එලෙස සිත තුළ ක්‍රෝධය සහ වෛරය සඟවා තබාගෙන ක්‍රියා කල කිහිපදෙනෙකු තිස්මඩ ග්‍රාමය තුළ විසූ බැවිනි.

අල්විස් වෙද මහත්තයා තිස්මඩ ග්‍රාමයේ විසූ කුලවතෙකු විය. කාගේත් ගෞරවාදරයට පාත්‍රවූ කඩවසම් වැඩිහිටියෙකු වූ ඔහු දරුවන් අටදෙනෙකුගේ ආදර බර පියෙකු විය. ඔහුගේ බිරිය එන්සො නෝනා නම් විය. වෙදැදුරෙකු වූවත් ඔහු ගත කළ දිවිය දුෂ්කර එකක් විය. අද සමහරෙකු කරන්නාක් මෙන් තම වෙදැදුරු කමින් අසීමිත ලෙස ධනය ඉපදීමේ හැකියාවක් එකළ නොවීය. එහෙයින් අල්විස් වෙද මහතාද අසීරුවෙන් නමුත් තමාට හැකි පමණ හොඳින් තම පවුල නඩත්තු කළේය. තම දරු දැරියන්ට හැකි ඉහළම අධ්‍යාපනය ලබාදීමටද ඔහු කටයුතු කළේය. ඔහු වාසය කල නිවස අබලන්වෙමින්

පැවතුනද එය පිළිසකර කිරීමේ කාර්යය ඔහු නිරතුරුවම කල් දැම්මේ තම දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිමවන තුරුය.

අල්විස් වෙද මහතාගේ වැඩිමහල් දියණිය සෝමලතා විය. තම දියණිය කෙරෙහි මහත් බලාපොරොත්තු අල්විස් වෙද මහතා තුල විය. ඔහු ඇ රැක බලාගත්තේ තම දෙනෙත මෙනි. සෝමලතා තම මූලික අධ්‍යාපනය මැණික්දිවෙල මහ විද්‍යාලයෙන් ලබාගත් අතර පසුව ඇය පිළිමතලාව මධ්‍ය මහ විද්‍යාලයට ඇතුලුව විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටියාය. කවදා හෝ තම ඇසවන් මේ දියණිය පවුලේ දියුණුව සලසාවියැයි බලාපොරොත්තුවක් අල්විස් වෙද මහතා තුළ විය. සෝමලතා දීප්තිමත් ශිෂ්‍යාවක්විය. එසේම අල්විස් වෙද මහතා සහ පවුලේ සියළුදෙනාගේම බලාපොරොත්තු සඵල කරමින් ඕ පේරාදෙණිය විශ්ව විද්‍යාලයට තේරී පත්වූ අතර තිස්මඩ ග්‍රාමයේ ප්‍රථම උපාධිධාරිණියද විය. ඇය නිදහස් අධ්‍යාපනයේ පින් මහිමයෙන් බිහිවෙමින් සිටි නව උගතුන් රැල්ලක සාමාජිකාවක් විය. එහෙත් සෝමලතා කිසිවිටෙක් තම උගත් කම හේතුවෙන් හිස උදුම්මාගත් තරුණියක් නොවීය. සෝමලතා ඇත්තෙන්ම ඉතාමත් චාම් කරුණාවන්ත චරිතයක් විය. ඕ පවුලේ සෑම දෙනා සමඟවම සුහදව කටයුතු කරන වගකීම් සහිත තරුණ කාන්තාවක් විය. පවුලේ සාමාජිකයින් පමනක් නොව තිස්මඩ ග්‍රාමයේ වසන අනෙකුත් සියළුදෙනා සමඟම ඉතාමත් සහයෝගයෙන් වැඩ කිරීම සෝමලතා ප්‍රිය කළේය. ඇගේ සිත තුළනම් අන් කිසිවෙකු කෙරෙහි තරහවක්, වෛරයක් නොවීය. ඇ දන්නා තරමින් නම් ඇය හට සතුරන් සිටියේද නැත. ඇත්තෙන්ම කිවහොත් ඇ කෙරේ සතුරු සිත් උපදවා ගත් කිහිප දෙනෙකු තිස්මඩ ග්‍රාමය තුල සිටි බව නොදැන සිටීම ඇගේ ආවාසනාව විය. සෝමලතා ස්වභාව ධර්මයට ප්‍රිය කළ තැනැත්තියක් විය. තම ගෙවත්ත තුල ඉතාමත් අලංකාරවූ රෝස මල් වගාවක් ඇය සතුවිය. ඊට සාත්තු සප්පායම් කිරීමෙන් සෝමලතා අසීමිත සතුටක් ලද්දාය. එසේම එය දුටු දුටුවන්ගේ සිත් සතුටු කරන අලංකාර දසුනක්ද විය.

සෝමලතා හට සෑහෙන කාලයක සිට පැවැත්වූ පෙම් සම්බන්ධතාවයක් වූ අතර එයට දෙපාර්ශ්වයෙන්ම ආශීර්වාදය හිමිව තිබුණි. ඇයගේ පෙම්වතා නමින් ගාමිණී ජයසිංහ විය. ඔහු පරිපාලන අධ්‍යයන ආයතනයේ පරිවර්තකයෙකු ලෙස රාජකාරි කළේය. මෙම පෙම්වතුන් දෙදෙනාගේ විවාහ මංගල්‍යය එක්දහස් නමසිය හැත්තෑ එක වසරේ සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට දින නියම කරගෙන තිබූ අතර, කිසිවෙකු නොසිතූ විපතකට සෝමලතා බඳුන්වූ ජූනි මාසය වනවිට ඒ සඳහා සියළු කටයුතු සම්පාදනය වෙමින් තිබුණි.

කෲර මිනිමරුවෙකුගේ ග්‍රහණයට සෝමලතා නතුවීම තිස්මඩ ග්‍රාමයේ බොහෝ දෙනෙකුට දරාගත නොහැකි සිද්ධියක් වූවද ඇගේ දියුණුව නොඉවසූ කිහිපදෙනෙකුද එම ග්‍රාමයෙහිම විසීම ඇයගේ අවාසනාව විය. මෙම කණ්ඩායම ඇතුලත ඇගේ ඥාතීන් කිහිපදෙනෙක්ද විය. මොවුන් තුළ සෝමලතා කෙරෙහි බලපැවැත්වූ ඊර්ෂ්‍යාව කඩුගන්නාවේ ඩෝසන් කුළුණ මෙන් උස යැයි සඳහනක් මෙම ඛේදවාචකය සිදුවූ දිනවල ඒ ගැනවූ පුවත් පත් වාර්ථාවකද සඳහන් විය.

# 4. අතුරුදහන් වීම

තිස්මඩ ග්‍රාමයට පිවිසිය යුතුවූයේ ඉතාමත් දුෂ්කර මාර්ගයක් හරහා විය. කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ කඩුගන්නාවේ ඩෝසන් කුළුන පිහිටි ස්ථානය අසළින් ඇතුළට විහිදී යන මාර්ගයකින් තිස්මඩ දක්වා යායුතු විය. ඉතාමත් තියුණු වංගු සහිත කඳුකර මාර්ගයක් දිගේ පොත්තෙපිටිය සහ මැණික්දිවෙල යන ගම් පසු කරමින් තිස්මඩ දක්වා ගමන් කළ යුතුය. 1971 වසරේදීද මහනුවර සිට තිස්මඩ ග්‍රාමය දක්වා ධාවනය වන බසයක් විය. එසේ නැතහොත් තිස්මඩ දක්වා යන්නෙකු නුවර සිට මැණික්දිවෙල දිවෙන බසයෙන් ගොස් එහිදී තිස්මඩ දක්වා යන දෙවන බසයකට නැගිය විය යුතු විය.මැණික්දිවෙල හන්දියේ සිට තිස්මඩ ග්‍රාමය දක්වාවූ සැතපුම් එකයි කාලක පමණවූ දුර ඉතාමත් පටුවූත් තියුණු නැග්මක් ඇති මාර්ගයක් දිගේ යායුතු විය. මෙම මාර්ගය දිවා කාලයෙහිදි නම් තරුණ අයෙකුට මඳක් අපහසුවෙන් හෝ පා ගමනින් යාහැක්කක් වුවද, ගොම්මන් වෙලාවක විශේෂයෙන් වැහිබර අඳුරු දිනක තරුණ කාන්තාවක් ගමන් කළ යුතු මාර්ගයක් නොවීය. එහෙත් කුමන හෝ කාරණාවක් නිසා සෝමලතා මේ ගමන ගියාය, නැතහොත් ඇයට යන්නට සිදුවිය. එය ඉතාමත් ඛේදනීය දරුණු ඉරණමකට ඇය භාජනය කරවන්නට සමත්වූ තීරණයක් විය.

1971 ජූනි මස විසි පස් වනදා සිකුරාදා දිනයක් විය. සෝමලතා මුණසිංහ නම්වූ මෙම අහිංසක තරුණිය තම අවසන් ගමන ගියේ මා කළින් සඳහන් කල මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා ඇති මාර්ගයෙහිදීය. යම් පුද්ගලයෙකුගේ ඉරණම හෝ දෛවය කළින්ම තීරණය වී ඇති දෙයක් ලෙසද විශ්වාසයක් සමහරෙක් තුළ පවතී. ඒ කෙසේ වූවත් මෙම ඉරණම්කාරී දිනයෙදී සෝමලතා තරුණිය මුහුණපෑ බිහිසුණු මරණය කිසිසේත් සිදු නොවී තිබිය යුතු විය. එයින් දිනූ කෙනෙක් නැතිය. සෝමලතාගේ මරණය ඇයගේ පවුලේ අයට දරාගත නොහැකි

දෙයක් විය. ගාමිණී ජයසිංහ නම්වූ ඇගේ පෙම්වතාද අන්ත අසරණ විය. සෝමලතාගේ ඝාතකයින්ද අවසානයේදී ඉන් ලබාගත් දෙයක් නොවිනි. මරණය ඔවුන්ටද පොදුවිය.

මෙම ඉරණම්කාරී දිනයේදී සෝමලතා රැකියාවට ගොස් නැවතත් නිවෙස බලා පැමිණියේ මහනුවර සිට මැණික්දිවෙල දක්වා ධාවනය වන බසයෙනි. මැණික්දිවෙලට සෝමලතා පැමිණෙන විට එහි සිට තිස්මඩ දක්වා දිවෙන බසය පිටත්වීමට සූදානම් වී තිබූ අතර සෝමලතා පැමිණි බසයේ රියදුරු බසයේ නලාව හැඬවූයේ තිස්මඩ දක්වා ගමන් ගන්නා මගියකු තම බසයේ සිටිනා බව දැන්වීම පිණිසය. එහෙත් සෝමලතාගේ අවාසනවාට තිස්මඩ බසයේ රියැදුරුට එම නළා හඬ නොඇසිනි. බසය පිටත් වී ගිය අතර සෝමලතා මැණික්දිවෙල තනිවිය. මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා දිවෙන ඊළඟ බසය පැමිණීමට තවත් පැය කිහිපයක් ගතවිය යුතුවූ බැවින් සෝමලතා මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා පා ගමනින් යන්නට පිටත් විය.

එක්දහස් නමසිය හැත්තෑ එක වසරේ ජූනි මස වනවිට සෝමලතා මහනුවර, ගැටඹේ පිහිටි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පුහුණුවන උපාධිධාරිණියක ලෙස සේවයේ යෙදී සිටි අතර ඒ වන විට රාජ්‍ය පරිපාලන සේවයේ පවත්වන විභාගයකට පෙනී සිටීමෙන් පසු එහි ප්‍රතිපල අපේක්ෂාවෙන් සිටියාය. ඇය රාජකාරි සඳහා පැමිණියේ තිස්මඩ ඇගේ නිවසේ සිටය. සාමාන්‍යයෙන් ඇය තිස්මඩ සිට මහනුවර දක්වා ධාවනය වන බසයෙන් හිමිදිරියේම පිටත්වී රැකියාවට පැමිණෙන අතර රාජකාරි නිමවා ආපසු යන්නේ මහනුවර - පොත්තෙපිටිය බසයෙන් හෝ මහනුවර - තිස්මඩ බසයෙන් යන දෙකින් එකකය. තිස්මඩ බසයෙන් පැමිණෙන දිනට සවස හතරයි කාල පමණ වනවිට නිවසට ළඟාවීමට ඇයට හැකිවන අතර පොත්තෙපිටිය බසයේ පැමිණියහොත් ඇය නිවසට පැමිණෙන විට සාමාන්‍යයෙන් සවස පහ මාර පසුවෙයි. සෝමලතා ප්‍රමාදවී තනිවම ඒ මඟ ඒම ගැන වැඩි කැමැත්තක් වෙද මහතා තුල නොවිනි. එබැවින් පියා දියණියට උපදෙස් දී

තිබුණේ කුමන හෝ කටයුත්තක් නිසා ප්‍රමාදවන්නේ නම් තනිවම තිස්මඩ නොපැමිණ මහනුවර රජවත්තේ සිටින අල්විස් වෙද මහතාගේ මිතුරෙකුගේ නිවසේ නවතින ලෙසටයි.

ජූනි විසිපස්වනදා සෝමලතා වෙනදා පරිදිම උදේ රැයින්ම තේ කෝප්පයක් පානය කර රැකියාවට පිටත්විය. එදින ඇය ඇඳ සිටියේ ලා රෝස පැහැති සාරියකි. ඊට අමතරව අත්බෑගයත්, කුඩයත් ඈ රැගෙන ගියාය. නිවසින් පිටත්වීමට පෙර සැමදා කරන්නක් වාගේම ඇය මවට වැන්දාය. තම දියණිය පනපිටින් දකින අවසන් අවාස්ථාව මේ යැයි මවට නොසිතෙන්නට ඇත. එසේ සිතීමට තරම සැකයක් බයක් කිසිවෙකු තුළ නොවීය.

එදින සවස සෝමලතා නිවසට පැමිණියේ නැත. එහෙත් වෙද මහත්තයා ඇතුළු පවුලේ කිසිවකු තුළ ඒ ගැන සැකයක් ඇති නොවූයේ ඇය නුවර රජවත්තේ මිතුරාගේ නිවසේ නවතින්නට ඇතැයි යන විශ්වාසය ඔවුන් තුළ තිබූ නිසාය. මෝසම් වැසි ඇරඹී තිබූ බැවින් නිවසට ඒමට නොහැකිව ඇය නුවර නතර වන්නට ඇතැයි ඔව්හු සිතූහ. ජූනි විසි පස්වන දින සිකුරාදා දිනයක් වූ බැවින් සහ සෙනසුරාදා නිවාඩු දිනයක්වූ බැවින් සෝමලතා ස්ථිර වශයෙන්ම පසුදින නිවසට ඒවියැයි වෙද මහත්තය ඇතුළු සියල්ලෝම සිතූ නිසා ඔවුන් ඒ ගැන සොයා බලන්නට නොගියහ. එහෙත් පසුදින එනම් විජූනි විසි හය වන සෙනසුරාදා බලාපොරොත්තුවූ පරිදි ඇය පැමිණියේ නැත. මෙයින් කළබලයට පත්වූ අල්විස් වෙද මහතා ඇය සොයා නුවර ගියේය. මුලින්ම ඔහු ගියේ ගැටඹේ පිහිටි සෝමලතාගේ රාජකාරි ස්ථානයටය. සිකුරාදා උදේ වරුවේ ඇය යම් කිසි රාජකාරී කටයුත්තක් සඳහා නුවර කච්චේරියට ගිය බව අල්විස් වෙද මහතාට එහිදී දැනගන්නට ලැබිණි. එබැවින් ඔහු ඊළඟට මහනුවර කච්චේරියට ගොස් ඇය ගැන සොයා බැලුවේය. එහි සිටියවුන් වෙද මහතාට දන්වා සිටියේ ආ රාජකාරිය නිම කළ සෝමලතා නැවතත් ගැටඹේ පිහිටි කාර්යලයට ගිය බවයි. ඒ අනුව නැවතත් ගැටඹේ පිහිටි සෝමලතාගේ රාජකාරි ස්ථානයට පැමිණි අල්විස් වෙද මහතා නැවතත් ඇය ගැන විමසා බැලීය. එහිදීද කිසිම තොරතුරක් නොලැබුනු බැවින්

ඊළඟට ඔහු රජවත්තේ වාසය කළ ඔහුගේ මිතුරාගේ නිවසට ගියේය.එහෙත් එහිදීද ඔහුට අසන්නට ලැබුනේ සිත් කළඹවන තොරතුරකි. එනම් ඇය දින කිහිපයකින් රජවත්තට නොපැමිණිනි බවය. මේ වනවිට වෙද මහතා හොඳටම කලබල වී සිටි අතර කල යුතු කිසිවක් සිතාගැනීමේ හැකියාවක් ඔහු තුළ නොවිනි. යම්කිසි හදිසි කාරනාවක් සම්බන්ධයෙන් සෝමලතා ගාමිණීව හමු වීමට කොළඹ ගියාදැයි සැකයක් ඔහු තුල ඇතිවිය. නැතහොත් මේ වනවිටත් ඇය ගෙදර පැමිණ සිටිනවා විය හැකියයි. කළබලවීම අනවශ්‍ය යැයි සිතූ ඔහු නැවතත් නිවෙස බලා ගියේය. අද මෙන් සන්නිවේදන පහසුකම් නොතිබුණු යුගයක ඔහුට මේ ගැන තවත් සොයා බැලීමට එදින නම් අවස්ථාවක් ලැබුනේ නැත. එබැවින් ඔහු විසිහත්වෙනි ඉරු දින නැවතත් මහනුවර ගිය අල්විස් වෙද මහතා කොළඹ කොටුව පොලිස් ස්ථානයේ කොස්තාපල් වරයකු ලෙස සේවය කළ තම පුතු සහ සෝමලතාගේ පෙම්වතාවූ ගාමිණීව ඇමතූ අල්විස් වෙද මහතා ඔවුන්ගෙන් තම දියණිය ගැන තොරතුරක් දන්නේදැයි විමසා සිටියේය. එහෙත් ඔහුගේ අවාසනාවට ඒ දෙදෙනාම සෝමලතා ගැන කිසිම තොරතුරක් දැන සිටියේ නැත. මෙයින් වඩාත් කළබලයට පත්වූ අල්විස් වෙද මහතා තම දියණියගේ අතුරුදහන් වීම වහාම මහනුවර පොලිසියට දන්වා සිටියේය. අල්විස් වෙද මහතා නැවතත් තම නිවෙස බලා පැමිණියේ වික්ෂිප්තවූ මනසකින් යුතුවය. තම දියණියගේ අතුරුදන් වීමෙන් කම්පාවට පත්ව සිටි බිරිය සහ දරුවන් සැනසූ ඔහු නැවතත් කඩුගන්නාව බලා ගියේය. අල්විස් වෙද මහතා තම දියණියගේ අතුරුදන් වීම ගැන කඩුගන්නාව පොලීසියද දැනුවත් කළ අතර මොහොතකින් මේ පිළිබඳ පොලිස් පණිවිඩ සහ උපදෙස් එහා මෙහා යන්නට විය. තම දියණිය කෙසේ හෝ සොයාගැනීමේ තිර අදිටනින් ඒ සඳහා ඕනෑම දෙයක් කිරීමට සූදානම්වී සිටි වෙද මහතා මින් පෙර කිසිදාක නොකළ අයුරෙන් සෝමලතා ගැන අනාවැකියක් බැලීම සඳහාද යාමට අමතක කළේ නැත. එදින සවස් වරුව වනවිට නැවතත් තිස්මඩ පැමිණි වෙද මහතා හිස ගිනිගත්තෙකු මෙන් එහා

මෙහා දුවමින් තම දියණිය ගැන මොනයම් හෝ තොරතුරක් සොයගැනීමට වෙහෙසුනේය. මේ අතරදී ඔහුට තම ඥාතියකු වූ අල්විස් මුදලාලි හමුවූ අතර වෙද මහතාට සිදුවී ඇති කරදරය ඇසූ අල්විස් මුදලාලි පැවසූ දෙයින් වෙද මහතා තවත් කලබලයට පත්විය. මුදලාලි පවසා සිටියේ ජූනි විසි පස් වන දින සවස මැණික්දිවෙල සිට තිස්මඩ යන මාර්ගයේදී සෝමලතාව ඔහු දුටු බවත් ළා රෝස පැහැති සාරියකින් සැරසී සිටි ඈ අත කුඩයක්දවූ බවත් තමාව හඳුනාගත් ඇය තමා සමඟ සිනාවී තිස්මඩ දෙසට පා ගමනින් ගිය බවත්ය. මෙය ඉතාමත් වැදගත් ආරංචියක් වූ අතර එයින් පසක් වූයේ විසි පස් වන සිකුරාදා සවස ඇය මැණික්දිවෙල දක්වා පැමිණ ඇති බවත් එහි සිට තිස්මඩ දක්වා පා ගමනින් යාමට පිටත්වී ඇති බවත්ය. එසේනම් ඇය අතුරුදන්ව ඇත්තේ මැණික්දිවෙල සහ තිස්මඩ අතරදීය. මෙම පුවතින් කලබලයට පත්වූ අල්විස් වෙද මහතා තම දියණිය සෙවීම සඳහා උදව් ඉල්ලා සිටි අතර ඉතා ඉක්මනින් එක් රැස්වූ පිරිස ලහි ලහියේ ඇය සෙවීම ආරම්භ කළහ.

අවට තිබූ තේ වතු සහ තේ පඳුරු අතර මෙන්ම බෝක්කු යටත් කාණු දිය අගල් වලත් ඔව්හු පිරික්සූහ. සවස හය හමාරට පමණ සෙවීමේ කණ්ඩායමේ සිටි අයෙකු හදිසියේ දුටුවේ මාර්ගයෙන් අඩි පහළොවක් පමණ පහළ ඇති මිනිස් අතකට සමාන දෙයකි. ඔහු වහාම අනෙක් අයට අඬ ගැසූ අතර සෝමලතාගේ කුඩා සහෝදරයාවූ චන්ද්‍රසිරි වහ වහා එදෙසට දිව ගියේය. මොහොතකින් ඔහුගේ මුවින් විලාපයක් නැගිනි. "අපි ඉඳලා වැඩක් නැහැ. අක්කව මරල දාලා" චන්ද්‍රසිරි විලාප දුන්නේය. පැය ගණනක සෙවීමේ මෙහෙයුම නිමාවී තිබුණි. එහෙත් එහි ප්‍රතිඵලය ඉතාමත් ඛේදනීය එකක්විය. ඉතාමත් අමානුෂික ලෙස ඝාතනය කර තිබූ සෝමලතාගේ මල සිරුර ඔවුනට හමුවී තිබුණි. ඇගේ ගෙළ සම්පූර්ණයෙන්ම සිරුරෙන් වෙන් වන්නට ආසන්නව තිබුණි. ඇය ඇඳ සිටි ළා රෝස පැහැති සාරියේ කොණක් ගුලි කොට ඇගේ මුව තුලට ඔබා තිබූ අතර තෙත බරිත වූ සිරුර පඳුරු කිහිපයක් අතර සැඟව තිබුණි.

## 5. මරණ පරීක්ෂණය

කොතරම් කුරිරු මනුෂ්‍ය ඝාතනයන් ලංකාව තුල සිදුවී තිබුණත් නව යොවුන් වියේ සිටි පුදින මල් කැකුළක් බඳුවූ සෝමලතාගේ ඝාතනය තිස්මඩ වාසය කල සියළු දෙනාගේම පාහේ සිත් සතන් කම්පනයට පත් කලේය. තම උසස් අධ්‍යාපන කටයුතු නිමවා රජයේ රැකියාවක නියුතුවී සිටි ඇයගේ සිත තුල බලාපොරොත්තු දහසක් තිබෙන්නට ඇත. මාස කීපයකින් යුග දිවියට ඇතුල් වන්නටත් ඇය සිහින දකිමින් සිටියාය. සෝමලතාගේ පවුලේ අයද ඇය ගැන මහත් බලාපොරොත්තු තබාගෙන සිටියහ. කා සමඟත් හිතවත් ඇය මෙලෙස කුරිරු ලෙස මරා දමන්නට හේතුවක් හෝ එසේ කල හැකි පුද්ගලයෙකු ගැන කිසිවෙකුට සිතා ගන්නට බැරි විය. මේ අපරාධයට වග කිව යුත්තන්ට වහාම දඬුවම් ලබාදිය යුතු බව සියළුදෙනාම කියන්නට විය. එහෙත් එවැනි ඉක්මන්වූත් සංවේදී වූත් ක්‍රියාදාමයකට පවතින නීතිය අනුව ඉඩක් නොවීය. කොතරම් කුරිරුවූ අපරාධයක් වුවද එය පවතින නීතිය අනුව ක්‍රියා කල යුතුය. සංවේදීව අපරාධ විමර්ශනයක් සිදු නොකළ යුතුය. එසේ කළහොත් එයම විත්තියේ වාසියට සිටීමද විය හැක. එබැවින් පොලීසිය ඉක්මන් නොවීය.

සෝමලතාගේ මළසිරුර සොයගැනීමෙන් අනතුරුව කාලය මදක් නිහඬව ගලා ගියේය. බොහෝ දෙනෙකු මේ ගැන නොසතුටට පත්වූවද පොලීසිය නිහඬ විය. කෙනෙකු පොලිසියේ ක්‍රියා කළාපය විවේචනය කළ අතර සමහරෙක් ප්‍රසිද්ධියේම පොලීසියේ නිහඬ භාවයට විරුද්ධව කතා කළහ. එහෙත් පොලීසිය ඉක්මන් නොවීය. ඔවුන්ට විරුද්ධව නැගුනු චෝදනා ඔවුහු නොතැකුහ.

එහෙත් අන් කිසිවෙකු නොදැන සිටි දෙයක්ද විය. සෝමලතාගේ ඝාතනය ගැන යම් හෝඩුවාවක් ඒ වනවිටත් පොලීසියට ලැබී තිබිණි. මෙයින් කලබලයට පත් නොවුනු පොලීසිය තම විමර්ශන කටයුතු වඩාත් පුළුල් කලේය. තිස්මඩ

වසන වෘත්තියෙන් ලී ඉරන්නෙකු වන සේනපාල නමැත්තා සෝමලතා අතුරුදහන් වූ දින සෝමලතාගේ සිරුර හමුවූ ඉඩමේ සිටිය බවට ඔත්තුවක් ඉතාමත් විශ්වාස කටයුතු මාර්ගයකින් පොලීසියට ලැබී තිබිණ. එසේ වූවත් ඉන් ඔබ්බට වෙන කිසිම තොරතුරක් සොයාගන්නට පොලීසියට හැකියාවක් ලැබුණේ නැත.

මේ අතර අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පැවැත්වුන අතර මුල්ම අවස්ථාවේ සිරුර සොයාගත් ස්ථානය පරීක්ෂා කිරීමට පැමිණියේ එවකට මහනුවර අධිකරණ වෛද්‍යවරයා ලෙස කටයුතු කළ වෛද්‍ය පාණ්ඩියන් මහතාය. ඒ සෝමලතාගේ සිරුර හමුවූ දිනට පසුදින එනම් ජූනි 28 වනදාය. ඒවනවිටත් සෝමලතාගේ සිරුර එහි තිබූ අතර එය කුණු වෙමින් පැවතිය නිසා ඉවසිය නොහැකි තරමේ දුගඳක්ද හමමින් තිබිණ. සෝමලතාගේ සිරුර තිබූ ස්ථානය ඔහුගේ දැඩි පරීක්ෂාවට ලක්වූ අතර වැදගත් කරුණු රාශියක් ඔහු විසින් නිරීක්ෂණය කරන ලදී. සෝමලතා අවසන් වරට හැඳ සිටි රෝස පැහැති සාරිය සහ හැට්ටය එලෙසම පැවති අතර ඒවා උනා දැමීමට තැත් කිරීමක සළකුණු කිසිවක් නොවීය. එක් පයක පාවහන එලෙසෙම රැඳී තිබුණු අතර අනෙක් පාවහන සිරුරට මදක් එපිටින් වැටී තිබිණ. සිරුර අසලම වක පනාවක් සහ සිල්ලර කාසි කිහිපයක් විසිරී තිබිනි. සෝමලතා පුරුද්දක් වශයෙන් පැළඳුවේ කරාබු යුවළක් පමණය. මළ සිරුරේ එම කරාබු දක්නට නොවීය.

සිරුර පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූයේ පේරාදෙණිය වෛද්‍ය විද්‍යාලයේ අධිකරණ වෛද්‍ය අංශයේ මහාචාර්ය රණසිංහ විසිනි. ඔහුගේ නිරීක්ෂණයන් අනුව සෝමලතා කන්‍යාවියක් වූ අතර දූෂණය කිරීම හෝ සොරකම් කිරීම ඝාතනයේ මූලික පරමාර්ථය විය නොහැකි බව තීරණය කළ හැකි විය. එසේ නම් ඇය ඝාතනයට ලක්වූයේ ඇයි? පොලීසියට ඇත්තෙන්ම මෙය ප්‍රශ්නයක් විය. කා සමඟත් මිතුරු කමින් සහයෝගයෙන් වැඩ කළකෙනෙකු වූ සෝමලතාව ඝාතනය කිරීමට තරම් වෛරයක් යමෙකුගේ

සිතට ආවේ ඇයි? එසේ ඈ සමඟ වෛර බැඳගත් පුද්ගලයා කවුද? පොලීසියට ආරම්භයේදී මෙය උභතෝකෝටික ප්‍රශ්නයක් විය. මහාචාර්ය වරයාගේ නිරීකෂණයන් අනුව සෝමලතාගේ ගෙළෙහි කැපුම් අටක් පමණ දක්නට ලැබුණි. ගෙළෙහි ඉදිරිපස ඉතාමත් ගැඹුරු කැපුම් තුවාළයක් වුනු අතර ග්‍රෛවී කශේරුකා පෙනෙන තරමට ගැඹුරු කැපුමක් විය. බෙල්ලේ සියළුම ප්‍රධාන රුධිර නාළ කැපී තිබුනු අතර අධික ලෙස රුධිට වහනය වී තිබුනි. මහාචාර්ය වරයාගේ මතය අනුව කැපුම් තුවාළයෙන් පසුව සෝමලතා ජීවත්වන්න ඇත්තේ මිනිත්තු කිහිපයක් වැනි කෙටි කාලයක් පමණය. ගෙළෙහි ඉදිරිපස කැපුම් තුවාලය තියුණු කැපෙන ආයුධයක් ගෙළ මත තබා තදින් ඇදීමකින් මෙම කැපුම සිදු කර ඇති බව මහචාර්ය වරයාගේ නිගමනය වූ අතර ඒ සඳහා අවම වශයෙන් කැපුම් දෙකක්වත් සිදුකර ඇති බවද ඔහු පවසා සිටියේය. වෙනත් කිසිදු තුවාලයක් මරණකාරියගේ සිරුරේ නොවූ අතර මෙමඟින් තීරණය කර හැකි වූයේ කැපුම යොදන විට ඇය සිහිසුන්ව සිටි බව හෝ නැත්නම් තව කිහිපදෙනෙකු තම බලය යොදා ඇයව මැඩ පවත්වාගෙන සිටි බවය. ඉතින් තමන් සතු එකම හෝඩුවාව පසු පස යාමට පොලීසිය අවසානයේදී තීරණය කළේය. ඒ අනුව සේනපාල පොලිස් අත් අඩංගුවට පත් විත. මේ අවස්ථාව වන විට ප්‍රධාන සැකකරුවා වූයේ සේනපාලයි.

අධිකරණ වෛද්‍යවරයෙකු මෙසේ පවසන්නේ කුමන කරුණු පාදක කොට ගෙනද නැත්නම් එසේ විශේෂිත වූ මතයන් ප්‍රකාශ කිරීමට අධිකරණ වෛද්‍යවරයෙකුට පවා හැකියාවක් ඇතිද යන්න යමෙකුට ප්‍රශ්ණයක් විය හැක. අධිකරණ වෛද්‍ය විශේෂඥයෙකුට තුවාල වල ස්වභාවය සහ අනෙකුත් නිරීක්ෂණ මඟින් මෙසේ විශේෂිතවූ මතයන් ප්‍රකාශ කිරීමට හැකි අතර බොහෝ අවස්ථාවලදී උසාවිය මඟින්ද එවැනි විශේෂිත මතයන් ගැන ඔවුන්ගෙන් විමසනු ලැබේ. මෙම විශේෂඥ මතයන් නඩු කටයුතු වලට මෙන්ම පොලීසියේ පරීකෂණ සඳහාද පිටුවහලක් සපයයි.

යම්කිසි තුවාලයක් සිරුරක දක්නට ලැබුණු විට ඒ ගැන මතුවන ප්‍රශ්ණ කිහිපයක් වේ. මේ ගැන බොහෝ අයට මතුවන ප්‍රශ්න වන්නේ මෙය කුමන ආකාර්යේ තුවාලයක්ද, මෙම තුවාලය කුමන ආයුධයකින් සිදුවී ඇත්ද යන දැයි. නමුත් ඊට අමතරව පැන නැගිය හැකි තවත් ගැටළු වේ. උදාහරණයක් ලෙස මෙය කෙසේ සිදුවිය හැකිද, එනම් තමා විසින්ම කරගන්න ලද්දක්ද නැතහොත් අනතුරකින් සිදුවිය හැක්කක්ද එසේත් නැතිනම් වෙනත් පිටස්තර පුද්ගලයෙකු විසින් සිදුකරන ලද දෙයක්ද යන්නයි. සෝමලතාගේ මරණයේදී මේ සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සොයාගැනීම ඉතාම වැදගත් වේ. එසේ නොකළහොත් වාර්ථා සැපයීමේදී හෝ සාක්ෂි දීමේදී මෙම ප්‍රශ්න වලට පිළිතුරු දීමට සිදුවිය හැක.

මෙහිදී අධිකරණ වෛද්‍ය විශේෂඥවරයා විසින් නිර්ණය කර තිබුණේ ගෙළෙහි ඇති තුවාලය කැපුම් තුවාළයක් ලෙසටයි. කැපුම් තුවාලයක් ඇතිවන්නේ තියුණු කැපෙන ආයුධයකින් කරන් පහර දීමකින් හෝ කැපුමකින්ය. මෙය ආකාර දෙකකින් කළ හැකි අතර එකක් වන්නේ තිඋණු කැපෙන දාරයෙන් පහර දීමෙන්ය. එහිදී සාමාන්‍යයෙන් සම සහ පටක ගැඹුරට කැපී යයි. ඇත්තෙන්ම සෝමලතාගේන්ගෙළෙහිද වූයේ එවැනි ගැඹුරු කැපුම් තුවාළයකි. නමුත් මෙහිදී මහාචාර්ය වරයාගේ අදහස වූයේ තියුණු ආයුධයක් ගෙළ මත තබා ඇදීමෙන් මෙම කැපුම සිදු කර ඇතැයි යන්නයි. එය එසේ විය හැකිදැයි විමසීමේදී කරුණු කිහිපයක් සැළකිය යුතුවේ. සාමාන්‍යයෙන් ගැඹුරු කැපුමක් වීමට බොහෝ විට හේතු වන්නේ තියුණු දාරයකින් පහර දීමය. මෙවැනි අවස්ථාවක පහර දෙන ආයුධය මරණකරු හෝ තුවාලකරුගේ දෙසට යොමුවන නිසාත් ඒ සඳහා විශාල බලයක් යෙදෙන නිසාත් එම බලය සිරුර දෙසට යොමුවන නිසාත් සම හා පටක ගැඹුරට කැපී යයි. සෝමලතාගේ ගෙළෙහි වූයේද එවැනි තුවාලයකි. ඉතින්

මහාචාර්යවරයා මෙය ඇදීමක් මඟින් සිදු කර ඇතැයි පැවසූයේ ඇයි? මෙහිදී ඔහු සම්පූර්ණ වශයෙන් කැපුම් තුවාළ 8 ක් නිරීක්ෂණය කර ඇත. අඩුම ගණනේ ඉන් දෙකේ සිට හතර දක්වා ගණනක් ගැඹුරු කැපුම් තුවාල විය හැකි බවටද ඔහු නිගමනය කර තිබුණි. මෙම කැපුම් සියල්ලම එකම ස්ථානයේ එකක් මත එකක් ආකාරයෙන් පිහිටා තිබුණි. සාමාන්‍ය පහර දීමකදි කැපුම් හතරක් එකම තැන එකම එකක් මත එකක් ආකාරයට පිහිටීම දුර්ලභ සංසිද්ධියක් වේ. එසේ වන්නේ පහරදීමකදී තුවාල කරු හෝ මරණකරු එකම ආකාරයට නොසිටින නිසාය. එනම් ඔවුන් එර දීමෙන් වැළකීම සඳහා තැත් කරන නිසාය. අනෙක් අතට මෙම ඝාතනයේදී සේනපාල පැවසූ පරිදි සෝමලතාව බිම හොවාගෙන ඇගේ දෙපා තදින් අල්වා ගැනීමෙන් හා ඝාතකයා ඇගේ උදරය මත වාඩිලාගෙන සිටීමෙන් සෝමලතාට තමාගේ ගැළවීම සඳහා කිසිවක් කරගත් නොහැකි තත්වයෙන් පසුවී ඇත. එවැනි අවස්ථාවකදී පිහිය ගෙළ මත තබා ඇදීමෙන් ගැඹුරු කැපුම් තුවාලයක් සිදු කිරීම ඝාතකයාට පහසුය. එබැවින් පිහිය ගෙළ මත තබා ඇදීමෙන් එකකට වඩා වැඩි කැපුම් ගණනක් සිදු කිරීමේ හැකියාවද ඇත. මල් කපන පිහිය තියුණු වක ගැසුණු දාරයක් ඇති පිහියකි. එමගින් මෙවැනි කැපීමක් සිදු කිරීමේදී තලය වක්‍රාකාර බැවින් එහි තුඩ සහ ඊට ආසන්න තල කොටස අනෙක් කොටස් වලට සාපේක්ෂව ගැඹුරට ගමන් කරයි. එබැවින් ඇදීමක් මඟින් ගැඹුරු තුවාලයක් කිරීම වඩාත් පහසු වේ.

කැපුම් තුවාළයෙන් පසුව සෝමලතා වැඩි වේලාවක් ජීවත් නොවන්නට ඇති බව මහාචාර්ය වරයා නිගමනය කෙළේ කෙසේද? කලින් විස්තර කල පරිදි සෝමලතාගේ ගෙලෙහි වූයේ ඉතා ගැඹුරු කැපුම් තුවාළයකි. මළ සිරුර නරක්වී තිබුණත් තුවාළයට අදාළ සමහර කරුණු හඳුනා ගැනීමට එය බාධාවක් නොවේ.මෙම කැපුම් තුවාලය ගෙළෙහි ඉදිරිපස සිට ගැඹුරට විහිදී ගොස් තිබූ අතර ග්‍රෛවී කශේරුකාද නිරාවරණය වී තිබුණි. එබැවින් ගෙළෙහි දෙපසම ඇති ශීර්ෂක ධමණි දෙකම කැපී ගොස් තිබූ අතර එලෙසම ශීර්ෂක ශිරා

දෙකද සම්පූර්ණයෙන්ම වෙන්වී ගොස් තිබුණි. ඉතින් ඒවායින් අධික ලෙස රුධිරය වහනය වන්නට ඇති බවට කිසිදු සැකයක් නැත.එමෙන්ම ප්‍රධාන රුධිර නාළ හතරක්ම කැපී ගිය කල්හී සිරුරේ සංසරණය වන රුධිරය ඉතා කෙටි කාලයක් තුල සිරුරින් පිටතට ගලායන බවත් තුවාළකරු ඉතාමත් ඉක්මණින් කම්පන තත්වයට පත්වන බවත් ස්ථිරය. එබැවින් සෝමලත ඉතාම කෙටි කාලයක් තුල මිය යන්නට ඇතැයි යන නිගමනය නිවැරදි වේ.

සෝමලතා ඒ අවස්ථාවේ කෑ ගැසුවේ නැත්තේ ඇයිදැයි තවත් කෙනෙක් ප්‍රශ්ණ කළ හැක. එසේ බැරි වීමට හේතු කිහිපයක් ඇත්..අවම වශයෙන් හේතු දෙකක් දැක්විය හැක. සෝමලතාගේ මළ සිරුර හමුවන අවස්ථාවේදීත් ඇය ඇඳ සිටි සාරියේ කොණක් ඇගේ මුව තුලට ඔබා තිබූ බව දක්නට ලැබුණි. සේනපාල විසින් දෙන ලද කට උත්තරයෙන්ද එය සනාථ විය. එවන් අවස්ථාවක යමෙකුට කෑ ගැසීමට අපහසුවේ. ඊට අමතරව තවත් කරුණක් ඇත. සෝමලතාගේ ගෙළහි වූ කැපුම නිසා ඇයගෙ ශ්වාසනාලය සහ ස්වරාලය යන කොටස්ද කැපී ගොස් තිබුණි. ඉතින් ස්වාරලය හානිවූ කෙනෙකුට කතා කිරීමේ හැකියාවක් කෙසේවත් නැත. එබැවින් සෝමලතා කෑ නොගැසීමෙහි කිසිදු අරුමයක් නොමැත.

පශ්චාත් මරණ පරීක්ෂණයේදී මහාචාර්ය වරයාගේ අවධානය තවත් කරුණු කිහිපයක් වෙතද යොමු විය. ඒ සෝමලතාගේ සිරුරේ තිබිය හැකි වෙනත් තුවාළ පිළිබඳවයි. අවාසනාවකට වාගේ සිරුර නරක්වෙමින් පැවති නිසා මෙම කරුණු නිරීක්ෂණය කිරීම අපහසු විය. පූතිභවනය වීම නිසා මෙම අපහසුතාවය ඇතිවීම සාමාන්‍ය සිද්ධියකි. නමුත් මේ නිසා වැදගත් නිරීක්ෂණ කිහිපයක් සිදු කිරීමට නොහැකිවීමේ පාඩුව නඩුවේ අවසාන තීන්දුව වෙතද බලපෑ හැකි අවස්ථාද නැත්තේ නොවේ.මහචාර්ය වරයාගේ විශේෂ අවධානය මරණකාරියගේ අත්වල මැණික් කටුව ප්‍රදේශය සහ වළලුකර ප්‍රදෙශ වලටද යොමු විය. එහිදී සම මත කිසිදු තුවාළයක් පැහැදිළිව දක්නට

නොලැබුණු නමුත් වළලුකර ප්‍රදේශ වල මෘදු පටකවල තැළුම් තුවාලයක ලක්ෂණ දක්නට ලැබුනු බව මහාචාර්ය වරයාගේ වාර්ථාවේ සඳහන්වී තිබිණි.මෙහි වැදගත් කම කුමක්දයැයි යමෙකුට සිතිය හැක. මහාචාර්ය රණසිංහ මහතා පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන අවස්ථාව වනවිට මරණය ගැන කිසිම හෝඩුවාවක් පොලීසිය වෙත ලැබී තිබුණේ නැත. සාමාන්‍යයෙන් බාහිර බලයක් යොදා පුද්ගලයකු මැඩපැවැත්වීමේදී මැණික් කටුවලින් සහ වළලුකර වලින් තදි අල්වා ගැනීම එක් ක්‍රමයක් වේ. මෙහිදී එම ප්‍රදේශවල තැළුම් තුවාළ ඇතිවීම පිළිගත් සංසිද්ධියකි. එබැවින් සෝමලතාගේ වළලුකර ප්‍රදේශ වල මෘදු පටක වල දක්නට ලැබුණු තැළුම් තුවාල නිසා මහාචාර්යවරයා පවසා සිටියේ සමහර විට ඝාතකයාට අමතර පුද්ගලයෙකු හෝ කිහිප දෙනෙකු එසේ සෝමලතාව බලය යොදා මැඩපවත්වාගෙන සිටි බවට සැකයක්ද මතුවන බවයි. ඔහු එය නිශ්චිත වශයෙන් නොපැවසුවද ඔහුගේ එම මතය සේනපාල විසින් දෙන ලද විස්තරය හා මනාව සසැඳිනි. අධිකරණ වෛද්‍ය විද්‍යාවේ මූලධර්ම සහ සිද්ධාන්ත අනුව සමහර අවස්ථාවල මෙවැනි මතයන් ඉදිරිපත් කළ හැකි අතර ඒවා නඩුවට අදාළ සමහර කරුණු සහ සාක්ෂි තිර කිරීමටද මහත් පිටිවහලක් වන අවස්ථාද ඇත.

## 6. සේනපාල

තමන් වෙත ලැබී තිබූ තොරතුරු අනුව යමින් පොලීසිය විසින් සේනපාලව අත් අඩංගුවට ගන්නා ලදී. ඒ 1971 ජූලි 8 වනදාය. එනම් සෝමලතා ඝාතනය කර සති දෙකකට පමන පසුවය. සේනපාලගෙන් කට උත්තරයක් ලබා ගැනීමෙන් පසුව එදිනම අධිකරණයට ඉදිරිපත් කරන ලදුව ජූලි 16 වනදා තෙක් ඔහුව රක්ෂිත බන්ධනාගාර ගත කෙරුනි. සේනපාල විසින් පොලීසියට ලබා දෙන ලද කට උත්තරයේ ඉතාමත් වැදගත් කරුණු රාශියක් අන්තර්ගත විය. සෝමලතාගේ මරණය සිදුවූ දින එම ප්‍රදේශයේ සිටි බව ඔහු විසින් මුලින්ම පිළිගන්නා ලද අතර ඉන් පසුව ඝාතනයට සම්බන්ධ කරුණු රාශියක් ඔහු පොලීසියට පවසා සිටියේය.

සේනපාල විසින් පොලීසියට සපයන ලද තොරතුරු අනුව යමින් ජූලි 8 වනදාට පසු දිනකදී රිචර්ඩ් සහ ජයවර්ධන යන අයවළුන් පොලිස් අත් අඩංගුවට ගන්නා ලදී.

මේ අතර සෝමලතා සම්බන්ධයෙන් තවත් තොරතුරක් පොලීසියට ලැබී තිබිණි. එනම් තිස්මඩ විසූ රෙදි සේදීම ජීවිකාව කරගත් කිරිමුත්තු නම් කාන්තාව දුටු දෙයක් සම්බන්ධවය. ජූනි 25 වනදා සවස මැණික්දිවෙල සිට සැතපුම් කාලක් පමන දුර තැනකදී කිරිමුත්තුට සෝමලතාව හමුවී ඇති පුවතයි. කිරිමුත්තු විසින් පසුව පොලීසියට ලබාදුන් කට උත්තරය අනුව ඇයට 25 වනදා සවස සෝමලතාව මුණගැසී තිබුණි. කිරිමුත්තු පොලීසියට පැවසූ පරිදි එදින සෝමලතාගේ කිසිම වෙනසක් ඇය දුටුවේ නැත. වෙනදා පරිදිම සිනහවී කිරිමුත්තු දෙස බැලූ ඇය කිරිමුත්තු පසුකර තිස්මඩ දෙසට පිය මැන ගියාය. කිරිමුත්තුව සෝමලතාට මුණගැසුනු තැනින් මඳක් තිස්මඩ පසට වන්නට තියුණු වංගුවක් විය. එතැනින් ඔබ්බට යායුතු මඟ පාළු පෙදෙසක් විය. දින දෙකකට පසු සෝමලතාගේ සිරුර හමුවූයේත් මෙම පාළු පෙදෙසට කිට්ටුවෙන් වීමෙන් තීරණය කර ගත හැකි වූයේ ඝාතකයින් අතට සෝමලතා හමුවූයේ මේ පෙදෙසේදිම බවයි.

1971 ජූනි 25 වන දින සවස 3.30ට පමණ සේනපාල 'හිරේ වැටුනු නිළමෙගෙ වත්තට ඇතුළුවී ඇත. තව දුරටත් ඔහු විසින් පොලීසියට පැවසූ සේ ඔහුගේ අභිප්‍රාය වී ඇත්තේ කොස් ගෙඩියක් කඩා ගැනීමය. මේ බව සනාථ කිරීම සඳහා පසු දිනෙක ඔහු විසින් එදා කඩන ලද කොස් ගෙඩියද පොලීසියට පෙන්වන ලදී. කොස් ගෙඩිය කඩා ගහෙන් බට ඔහුට ඊට මඳක් දුරින් පඳුරු සෙලවෙන ලෙසක් පෙනිනි. එය කුමක්දැයි බැලීමට සේනපාල එදෙසට ගියේය. එසේ ගිය ඔහුට මදක් එපිටින් සිටින ප්‍රේමදාස නමැත්තා පෙනිනි. ප්‍රේමදාසව ඔහු දැන සිටි හෙයින් ඔහුට කතා කිරීමට සිතා සේනපාල ඔහු අසළට ගියේය. එහිදී ඔහු දුටු දෙයින් සේනපාලගේ සිත තිගැස්සිනි. ප්‍රේමදාසගේ වැඩිමහල් සහෝදරයා වූ රිචර්ඩ් නමැත්තා එතැන ලී යොදා තනා තිබූ වේදිකාව උඩ බිම වැතිරී සිටි කෙනෙකුගේ උදරය උඩ දෙපා දෙපසට සිටිනසේ දමා වාඩිවී සිටියේය. රිචර්ඩ් සේනපාලව හැඳින ගත්තේය. ඊළඟට ඔහු සේනපාලට ඔහු අසළට එන ලෙසට සන් කළේය. රිචර්ඩ් තිස්මඩ ප්‍රදේශයේ දාමරික කම් වල නියැලෙමින් සිටි අයෙකි.එබැවින් ඔහුගේ වචනයට අවනත නොවී ඉන්නට බියක් සේනපාල දැනුනි. රිචර්ඩ් සේනපාල දෙස බලා මෙසේද කීවේය. "දුවන්න එපා උඹ දැන්. උඹ දිව්වොත් මේ වැඩේ කරන්න බැරිවෙනවා. අනෙත් එක උඹවත් මේකට අහු වෙනවා"මේ වදනින් තමාගේ සිත තුළ බියක් ඇතිවූ බව සේනපාල පොලීසියට කියා සිටියේය. එබැවින් ඔහු රිචර්ඩ් කී පරිදි වැඩ කළේය. තවත් රිචර්ඩ් සිටි පැත්තට ගිය සේනපාල බිම හොවා සිටි සෝමලතාව හඳුනා ගත්තේය. ජයවර්ධන නමැත්තා සෝමලතාගේ දෙපය තදින් අල්වා ගෙන සිටි අතර සාරියේ කොනක් සෝමලතාගේ මුව තුලට ඔබා තිබුණි. 'මේ මොන අපරාධයක්ද කරන්නෙ' සේනපාල රිචර්ඩ්ගෙන් විමසීය. 'උඹ කට වහගෙන පැත්තකට වෙලා හිටපං. මේකට කට දාන්න එපා' රිචර්ඩ් ඔහුට තර්ජනය කළේය. තව දුරටත් කතා නොකල සේනපාල සිදුවන දෙය දෙස බලා සිටියේය. සෝමලතාගේ අත් දෙක එක අතකින් අල්ලා ගත් රිචර්ඩ් අනෙක් අතට තියුණු මල් කපන පිහියක් ගත්තේය. ඉන්පසු

තියුණු පිහිය සෝමලතාගේ ගෙළට තබා තද කළේය. මරණ බියෙන් ඇලළුනු සෝමලතාගේ දෙනෙතින් කඳුළු ගලා ගියේය. තවත් පිහිය ගෙළට තද කළ රිචර්ඩ් සෝමලතාගේ ගෙළ කැපීමට පටන් ගති. මේ කුරිරු ක්‍රියාව බලනු නොරිසිව සේනපාල ඉවත බලාගත්තේය. ඒ වන විට ඔහු සිටියේ රිචර්ඩ් සිටි තැනට අඩි අටක් පමණ නුදුරෙන්ය. තමා සිටි තැනින් පලා යාමට සේනපාලට සිතුනි. 'උඹ දිව්වොත් මම උඹවත් මරණවා'යි රිචර්ඩ් තර්ජනය කළ හෙයින් සේනපාල මඳක් පසුබා ගියේය. සේනපාල නැවතත් සෝමලතා බිම හොවා සිටි දෙස බැලුවේය. ඒ වන විට රිචර්ඩ් තම කාර්යය නිම කර තිබුණි. සෝමලතාගේ සිරුර මඳක් සලිත විය. ගෙළ පෙදෙසින් රුධිර ගංගාවක් ගලා ගියේය. මොහොතකට පසු ඇගේ සිරුර නිසල විය. සෝමලතා මිය ගිය බව සේනපාලට තේරුම් ගියේය. ඔහුගේ සිතට දුකක් දැනුනි. මේ අසරණ තරුණියගේ ජීවිතය ගලවා ගැනීමට තමා කිසිවක් නොකළේ ඇයිදැයි ඔහුට සිතුනි. එසේම තම ජීවිතය ගැන බියක්ද ඔහුට ඇතිවිය.

එහෙයින් පලා යන්නට තිබූ උවමනාව බලෙන් යටපත් කරගත් සේනපාල නැවතුනේය. ඒ වනවිට සෝමලතාගේ ප්‍රාණය නිරුද්ධවී තිබුණි. සේනපාලට නැවතත් මෙයින් ගැළවී යාමේ අවශ්‍යතාවය ඇතිවිය. රිචර්ඩ් එයට විරුද්ධවූ නමුත් සේනපාල තමන්ට යන්නට ඕනෑ බව එක හෙළාම කියා සිටියේය. අවසානයේදී රිචර්ඩ් කියා සිටියේ සේනපාලට ඉවත්ව ගොස් නැවතත් ආපසු පැමිණෙන ලෙසටයි. සේනපාල පිටත්වූ අතර එතෙක් නිහඬව සිටි ප්‍රේමදාස ඉවත්ව යන සේනපාල පසු පසින් පැමිණියේය. සේනපාල එතැනින් නික්ම ගියේ ටිකිරිගේ කඩ කැල්ලටය. කඩය තුළට ගිය ඔහු බීඩි කිහිපයක් මිළදී ගෙන ඉන් එකක් දල්වා ගත්තේය. දුම් උගුරු දෙක තුනක් ඉක්මණින් ඉහළට ගත් ඔහුට සිත තුළ වූ බිය මඳක් අඩුවූවායැයි සිතිනි. එහෙත් කඩ මිදුලේ සිට තමා දෙස බලා සිටින ප්‍රේමදාස දුටු ඔහුට මොහොතකට කලින් දුටු කුරිරු ක්‍රියාව මතක් විය. නැවතත් ඔහුගේ ගත කිළිපොළා ගියේය.ප්‍රෙමදාස දෙසට ගිය ඔහු තමාට නිවසට යන්නට ඕනෑ බව ප්‍රේමදාසට කියා සිටියේය. එහෙත් ප්‍රේමදාස එයට විරුද්ධ විය. 'රිචර්ඩ් උඹට

කිව්වෙ ආපහු එන්න කියලයි' ඔහු අවවාදයක ස්වරූපයෙන් සේනපාලට කියා සිටියේය. ප්‍රේමදාසගේ බල කිරීමත්, රිචර්ඩ් කෙරෙහි තිබූ බය නිසාත් සේනපාල නැවතත් රිචර්ඩ් සිටි තැනට පැමිණියේය. ආපසු පැමිණි සේනපාලට සහ ප්‍රේමදාසට රිචර්ඩ් පැවසූවේ සෝමලතාගේ ප්‍රාණය නිරුද්ධ සිරුර වෙන තැනකට ගෙන යායුතු බවටය. ඉන්පසු රිචර්ඩ් සහ ජයවර්ධන දෙදෙන සෝමලතාගේ සිරුර ඔසවා ගත් අතර සේනපාලත් ප්‍රේමදාසත් ඔවුන් පසු පසින් ගමන් කළහ. අතරමගදී සෝමලතාගේ පය රැඳි සෙරෙප්පුවක් බිම වැටුණු අතර ප්‍රේමදාසගේ අණ පරිදි සේනපාල එය අහුලා ගත්තේය. මැණික්දිවෙල තිස්මඩ මාර්ගය ආසන්නයේ ඇති ස්ථානයකට ගෙනා සිරුර රිචර්ඩ් සහ ජයවර්ධන විසින් එහිවූ අගලක් තුළට දමන ලදී. ඉන්පසු සේනපාලට තර්ජනය කළ රිචර්ඩ් සේනපාල ලවා අතු ඉති දම්මවා සිරුර නොපෙනෙන ආකාරයට ආවරණය කරන ලදී. ඉන්පසු ඔවුහු එතැනින් ඉවත්ව යන්නට සැරසුනහ. මේ අවස්ථාවේ සෝමලතාගේ සිරුර අසළට ගිය ප්‍රේමදාස ඇගේ කනේ පැළඳ තිබූ කරාඹු යුවළ ගලවාගන්නා ආකාරය සේනපාල දුටුවේය. විසිර යන්නට මත්තෙන් රිචර්ඩ් විසින් සේනපාලට තර්ජනය කර සිටියේ මෙම සිද්ධිය කිසිවෙකුටත් නොකියන ලෙසටත් එසේ නොකළහොත් සේනපාලවත් මරා දමන බවත්ය.

සෝමලතාගේ මළ සිරුර හමුවන අවස්ථාවේ සේනපාලද එහි සිටියත් රිචර්ඩ් කෙරෙහිවූ බිය නිසා මේ ගැන කිසිවක් නොපැවසූ බව ඔහු පොලීසියට කියා සිටියේය.

සේනපාල විසින් පොලීසිය වෙත ලබා දුන් කට උත්තරය අනුව රිචර්ඩ් සහ ජයවර්ධන යන දෙදෙනා අත් අඩංගුවට ගන්නා ලද අතර සේනපාල විසින් පවසනදේ පිළිබඳවද පරීක්ෂා කර බලන ලදී. සෝමලතාගේ සිරුර හමුවූ ස්ථානය සහ ඒ අවටද නැවතත් පොලීසියේ පරීක්ෂාවට ලක් විය.

සෝමලතාව ඝාතනය කරනු ලැබූ දින කිරිමුත්තුට ඇයව මුණගැසුනේ මැණික්දිවෙල සිට සැතපුම් කාලක් පමණ

ඔබ්බෙහිදීය. ඊට මඳක් එපිටින් තිස්මඩ පාරේ තියුණු වංගුවක් සහිත ස්ථානයක් විය. ඒ ප්‍රදේශය විශේෂයෙන්ම සවස් කාලයේදී පාළු බවක් උසුළන ප්‍රදේශයක් විය. හිරේ වැටුනු නිළමෙගෙ වත්ත මේ ආසන්නයේ තිබූ අතර සෝමලතාගේ සිරුර හමුවූයේද එහි තිබීය. නිළමෙගෙ වත්ත සාමාන්‍යය උඩරට ඉඩමක්ම විය. එහි අත් හැර දමනලද තේ වගාවක් තිබුණු අතරතැනින් තැන වල් වැදුනු තේ පඳුරුද, ළඳු කැලෑවක්ද, කොස්, දෙල් ඇල්බීසියා වැනි ගස්ද තිබුණි. මේ ඉඩමේ තිබෙන කොස් සහ දෙල් පොදු දේපළක් වැනි විය. ඕනෑම කෙනෙකුට තමන්ට කැමති වේලාවක වත්තට ඇතුළුවී තමන්ට කැමැති දෙයක් රැගෙන යාමේ නිදහස තිබුණි. ඉතින් සේනපාල වැන්නෙකු අවේලාවේ එහි සිටීම කිසිසේත්ම අරුමයක් නොවීය. පොලීසියට තිබුණු එකම ප්‍රශ්නය නම් සේනපාල පවසන සෑම දෙයක්ම ඒ ආකාරයෙන් පිළිගන්නවාද නැද්ද යන කාරණයයි.

මෙම ගස් වලට අමතරව අත්හැර දමන ලද පොල් ගස් කිහිපයක්ද ඉඩමේ විය. කහ පාටින් මල් පිපෙන සූර්යකාන්ත ශාක බොහෝමයක්ද මෙම ඉඩමේ විය. වැසි කාලයට සිහින් ජල දහරා ගණනාවක් ඉඩම හරහා පහල ඇති නිම්නයට ගලා යන අතර කහ පාටින් දිලෙන සූර්යකාන්ත මල් එයට අමුතුම සුන්දරත්වයක් එකතු කලේය.

ඉඩමේ පිහිටීම මෙම අපරාධ විමර්ශණයට වැදගත් විය. පොලීසිය කරන ලද විමර්ශනයේදී මෙන්ම වෛද්‍ය පාණ්ඩියන් මහතාගේ මූලික විමර්ශනයේදීද නිරීක්ෂණය කරන ලද වැදගත් කරුණු රැසක් විය.

අපරාධ විමර්ශනයකදී පරීක්ෂණ කණ්ඩායමේ අවධානයට යොමුවන කරුණු රැසක් වේ. ඉන් එක කරුණක් වන්නේ ස්ථානය හෝ අපරාධය කරන ලද ස්ථානයයි.මෙහිදී සෝමලතාගේ සිරුර හමුවූයේ මැණික්දිවෙල තිස්මඩ මාර්ගයට ඉතා නුදුරෙන් වූ තැනකය. මාර්ගය අසළ ස්ථානයකදී මෙවැනි අපරාධයක් කිරීමට යමෙකු සිතන්නේනම් එය ඉතා අවදානම්

සහගත කාර්යයකි.මන්දයත් එවැනි අවස්ථාවක මාර්ගයේ යනෙන කෙනෙකු නෙත ගැටීමේ අවදානමක් ඇති නිසාය. එබැවින් දත් කරුණු සළකා බැලූ විට මෙම ඝාතනය සිදුවන්නට ඇත්තේ සිරුර හමුවූ ස්ථානයේදී නොව වෙනත් ස්ථානයකදී  බවට පොලීසියට එක්වරම ඒත්තු ගියේය. ඊට තුඩු දුන් තවත් හේතුවක් විය. එනම් මූලික ස්ථාන පරීක්ෂාවේදී සෝමලතාගේ අත්බෑගය, කුඩය සහ ඈ එදා සාරියට ගසා තිබූ සාරිකටුව ඉඩමේ  පහළ ලී වලින් සාදා තිබූ වේදිකාවක් වැනි ස්ථානයක තිබී හමුවීමය. මේ කරුණු සේනපාල පවසා සිටි තොරතුරු හා සසැඳීමේදී එකිනෙක හා ගැලපෙන බවද පොලීසියට ඒත්තු ගියේය. එයින් සිතා ගත හැකි අනෙක් කාරණය වූයේ සේනපාල පවසන දේ බොහෝ දුරට සත්‍ය බවය.

සේනපාලගේ ප්‍රකාශයට අමතරව පොලීසිය හට තවත් තොරතුරක් ලැබී තිබුණි. එනම් ජූනි 26 වනදා සවස හේරා හෙවත් ඇබිත්තයා නැමැති පුද්ගලයා රිචර්ඩ් සමඟ අල්විස් වෙද මහත්තයාගේ නිවසට ගිය බවයි. ඇත්තෙන්ම රිචර්ඩ් එහි ගියත් ඔහු සිටියේ නිවසට මඳක් දුරින්ය.  හේරා වෙද මහත්තයාට පවසා සිටියේ මේ නිවස දෙසින් හඬන ශබ්දයක් ඇසුනු බැවින් රිචර්ඩ් තාමාවත් කැටිව එය විමසීමට පැමිණි බවය. මෙය සැක උපදවන කරුණක් වූයේ වසර ගණනාවකින් වෙද මහතාගේ නිවසට රිචර්ඩ් පැමිණ නොතිබුණ නිසාය . අනෙක් අතට රිචර්ඩ්ගේ නිවස තිබුණේ සෑහෙන දුරකින් බැවින් එවැනි ශබ්දයක් ඔහුට ඇසුනේ කෙසේදැයි යන්න විශ්මය දනවන සුළු කරුණක් විය.

සෝමලතාගේ මරණය පිළිබඳ පරීකෂණ තව දුරටත් පැවැත්විනි. මේ ගැන නීති මාර්ගයෙන් කටයුතු කිරීමට ප්‍රථම ඝාතනය ගැන තව  කරුණු සොයා ගැනීම සුදුසු බව පොලීසියේ හැඟීම විය. සේනපාලගේ සාක්ෂිය මතම පමණක් විශ්වාසය තබා කටයුතු කිරීම නොසුදුසු බව පොලීසියේ අදහස

විය. එබැවින් ඝාතනය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට පොලීසිය තීරණය කළේය.

මෙහිදී සොයාගත යුතුවූ තව කරුණු කිහිපයක් විය. එළෙසෙම පශ්චාත් මරණ පරීක්ෂණයේ වාර්ථාවද ඒ පිළිබඳ අධිකරණ වෛද්‍යවරයාගේ මතයන්ද පොලීසියට අවශ්‍ය විය. ඇත්තෙන්ම කිවහොත් පශ්චාත් මරණ පරීක්ෂණයේදී සොයා ගන්නා කරුණු පිළිබඳ තම මතයන් අධිකරණ වෛද්‍යවරයා තම මතයන් ඉදිරිපත් කල යුත්තේ පොලීසියට නොව උසාවියටයි. එනම් නඩු විභාගය පැවැත්වෙන විට එහි සාක්ෂි දීමට කැඳවූ විටදීයි. එම මතයන් නඩුවේ අවසාන විනිශ්චය ලබාදීමට උපකාරී වන ආකාරයේ මතයන් වේ. එබැවින් මේ අවස්ථාවේදී මතයන් වශයෙන් මා අදහස් කළේ පොලීසියේ ඉදිරි විමර්ශන කටයුතු සඳහා උපකාරී වන විද්‍යාත්මක තොරතුරුය.

එබැවින් පොලීසිය ස්ථාන පරීකෂාව කල වෛද්‍ය පාණ්ඩියන් මහතාවද, පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කල මහාචාර්ය රණසිංහ මහතාවද හමුවී කරුණු විමසා සිටියේය. සෝමලතාගේ මරණය සිදුවී ඇත්තේ කෙදිනද, ඇයව ඝාතනය කිරීම සඳහා යොදා ගෙන ඇති ආයුධය කුමන ආකාරයක එකක්දැයි දැන ගැනීමට ඔවුනට අවශ්‍ය වී තිබුණි.

මහාචාර්ය වරයා විසින් සෝමලතාගේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරනු ලැබුවේ ජූනි විසි අට වනදා දහවල් ය. කලින් සඳහන් කළ පරිදි සෝමලතාගේ සිරුර හමුවනවිටත් එය කුණුවී යමින් තිබුනි. එහෙයින් මරණයක මූලික අවස්ථාවේදී දැකිය හැකි පශ්චාත් මරණ ලක්ෂණ කිසිවක් මෙම කාල නිර්ණය සඳහා යොදා ගැනීමේ හැකියාවක් තිබුණේ නැත.

පුද්ගලයෙකු මරණයට පත්වූ පසු පශ්චාත් මරණ විපර්යාස කිහිපයක් සිදුවේ. මේවා නම් ප්‍රාථමික ශිථිලතාවය, අධෝස්ථිතිය, මෘත කාඨින්‍යය සහ පූතිභවනය (කුණුවීම ) යන

විපර්යාස වේ. මේව මරණ අවස්ථාවේ සිට දින කිහිපයක් ඇතුලත දැක ගත හැකි විපර්යසවේ. සාමාන්‍යයෙන් අළුත් මළ සිරුරක  මෙම කාල නිර්ණය සඳහා යොදා ගත හැකි තවත් දෙයක් ඇත. ඇත්තෙන්ම මරණය සිදුවී කොපමන කාලයක් වේදැයි යන්න නිර්නය කිරීමේදී තනි නිර්ණායකයක් වශයෙන් යොදා ගත හැකි ඉතාමත් නිවැරදි ක්‍රමය වන්නේ මෘත ශරීරයේ සිසිළනයයි. සාමාන්‍යයෙන් නිරෝගී පුද්ගලයෙකුගේ දේහ උෂ්ණත්වය ෆැරන්හයිට් අංශක 98.4 ක් හෙවත් සෙල්සියස් අංශක 37 ක් පමණ වේ. යම් පුද්ගලයෙකු මරණයට පත්වූ විගස දේහ් උෂ්ණත්වය සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යෑමේ දේහ කාර්යාවලිය අකර්මණ්‍ය භාවයට පත්වන අතර දේහ උෂ්ණත්වය පහළ වැටීම ඇරඹේ. මෙය ඒ අවස්ථාවේදී පවතින පාරසරික උෂ්නත්වය දක්වා ක්‍රම ක්‍රමයෙන් සිසිළනය වේ. මෙම සිසිළන වේගය මඟින් මරණය සිදුවූ කාල වකවානු තීරණය කිරීම ඉතාමත් නිවැරදි ක්‍රමයක්වේ. එහෙත් මේ සඳහා යම් කාල පරාසයක් තුල උෂ්ණත්ව අගයන් කිහිපයක් ලබා ගත යුතුය.අවාසනවාකට මෙම ක්‍රමය සෝමලතාගේ මරණය සිදුවූ කාල වකවානු තීරණය කිරීමට යොදා ගත නොහැකි විය. මූලික හේතුව වූයේ මළ සිරුර හමුවනවිටත් එය කුණු වෙමින් පැවතිය නිසාය. දේහ උෂ්ණත්වයේ පහළ වැටීම යොදා ගත හැක්කේ එය පාරිසරික උෂ්ණත්වය දක්වා පහළ වැටෙන තෙක් පමණි.සෝමලතාගේ මළ සිරුර හමුවනවිට එම කාල පරාසය පසුවී තිබුණු හෙයින් මෙම ක්‍රමය යොදා ගැනීමට හැකියාවක් තිබුණේ නැත.  තවද මළ සිරුරක් එළිමහනේ තිබෙන විට විශෙෂයෙන් වර්ෂාව සුළං වැනි පාරිසරික තත්වයන් පවතින විට මෙම උෂ්ණත්වය පහල වැටීමේ වේගය විටින් විට වෙනස් වන නිසා එම ක්‍රමය යොදා ගැනීමේ ගැටළු ඇතිවේ.

ජූනි 25, 26 සහ 27 යන දින තුන තුළම වරින් වර වැසි ඇද හැළුනු බැවින් සමහර කරුණු නිරීක්ෂණය කිරීමේදීත් සාක්ෂි පරීක්ෂා කිරීමේදීත් බාධාවන් රැසකට මුහුණ දීමට පොලීසියට සිදුවිය.

මහාචාර්ය රණසිංහ පොලීසියට පවසා සිටියේ ඔහුගේ නිර්ණය අනුව පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට දින 3ක් හෝ 4 කට පෙර සෝමලතාගේ මරණය සිදුවී ඇති බවට අනුමාන කළ හැකි බවයි. මෙය පොලීසියට වැදගත් වූයේ මෙම කාල වකවානුව මරණය සිදුවූවයැයි කියන ජූනි 25 වනදා සමඟ සසැදෙන නිසාය.

ඊට අමතරව පොලීසියට දැනගත යුතුවූ තව කරුණක් විය. එනම් සෝමලතාව ඝාතනය සඳහා යොදාගෙන ඇත්තේ කුමන ආකාරයක ආයුධයක්ද යන වගයි. මහාචාර්ය වරයාගේ මතය වූයේ එය තියුණු වූත් දිගු තලයක් ඇති පිහියක් බඳු ආයුධයක් විය යුතු බවයි. ඊට අමතරව ඔහු පවසා සිටියේ බොහෝ දුරට එම පිහිය වක ගැසුණු තලයක් සහ කැපුම් දාරයක් සහිත එකක් විය හැකි බවයි. මේ විස්තරයද සේනපාල විසින් පොලීසියට දෙන ලද කට උත්තරයේ සඳහන් කල මල් කපන පිහිය සන්න සහ සසැඳිණි. මල පිහිය රා මදින්නන් විසින් භාවිතා කරන උපකරණයක් වන අතර එය සෑහෙන පමන ඝනකමක් ඇති වක ගැසුනු කැපෙන දාරයක් සහිත පිහියකි. සමහරෙක් මෙම කාර්යය සඳහ මන්න පිහිද උපයෝගී කර ගනිති. නමුත් සේනපාල විසින් එය මල් පිහියක් ලෙස විශේෂයෙන්ම සඳහන් කළ නිසා පොලීසිය එය එසේ විය යුතුයැයි තීරණය කළේය.

මහාචාර්ය වරයා තව දුරටත් පවසා සිටියේ මරණකාරියගේ ගෙළෙහි ඇති තුවාළයෙන් අධික ලෙස රුධිර වහනය විය යුතු බවය. එය එසේනම් ඝාතනය සිදු කරන ලද තැන බිම මත අධික රුධිර ප්‍රමාණයක් ගලා යා යුතුය. මෙමගින් ඝාතනය සිදු කල තැන අඳුනා ගැනීමේ හැකියාවක් ඇත. එහෙත් අවාසනාවන්ත කරුණක් වූයේ පොලීසිය විසින් ස්ථාන පරීකෂාව කිරීමට ප්‍රමාද වීමත් එම කාලය තුල විටින් විට වැසි ඇද හැලීමත්ය. මුල් අවස්ථාවේදී එනම් ජූනි 28 වන දින වෛද්‍ය පාණ්ඩියන් විසින්ද පසුව පොලීසිය විසින්ද ස්ථාන

පරීක්ෂාවක් සිදු කරන ලද නමුත් මෙම රුධිර වහනය පිළිබඳ ඔවුන්ගේ අවධානය ඒවනවිට යෙදී නොතිබීමයි. කෙසේ වෙතත් පසුවී හෝ පොලීසිය විසින් ස්ථාන පරීක්ෂාවක් සිදු කළ නමුත් එහිදී විශේෂ යමක් සොයා ගැනීමට ඔවුන් අපොහොසත් විය. මේ පිළිබඳ මුල්ම ස්ථාන පරීක්ෂාව සිදු කරනු ලැබූවේ වෛද්‍ය පාණ්ඩියන් මහතා විසින් ජූනි මස 28 වනදා වූ අතර එහිදී ඔහුගේ නිරීක්ෂණයට ලී වලින් තනන ලද වේදිකාවද ලක්වූවේය. එහිදී සෝමලතාගේ අත්බෑගය, කුඩය සහ සාරි කටුව එම වේදිකාව මත් තිබී හමුවී තිබිණි. නමුත් සැළකිය යුතු වෙනත් නිරීක්ෂණයක් ඔහු විසින් සිදු කර නොතිබුණි. රුධිර වහනයක් සළකුණක් හෝ රුධිරපැල්ලම් කිසිවක් ඔහුගේ නිරීකෂණවල සඳහන් වී නොතිබුණි. සමහර විට එම දින දෙක තුන තුල වරින් වර ඇද වැටුනු වර්ෂාව නිසා ඒවා සේදී ගියා විය හැකිය. ඉතින් පොලීසිය රුධිර සළකුණු සෙවීමේ කාර්යය අත් හැර දැමුවේය.

ඉන්පසු ඔවුන්ගේ වැඩි අවධානය යොමු වූයේ සෝමලතා ඝාතනය කිරීම සඳහා යොදා ගත් ආයුධය සොයා ගැනීම සඳහාය.මේ ගැන නිසි තොරතුරක් ඔවුන් සතු නොවූවත් කෙසේ හෝ එම ආයුධය සොයා ගැනීමේ තිර අදිටනින් ඔව්හු ක්‍රියා කළහ. ඔව්හූ සැකකරුවන් තිදෙනා එනම් රිචර්ඩ්, ජයවර්ධන සහ ප්‍රේමදාස යන අයවළුන් පොලීසිය විසින් අත් අඩංගුවට ගනු ලැබූයේ ජූළි 8 වනදාට පසු දිනෙකය. එහිදී සැකකරුවන් තිදෙනාගෙන්ම කට උත්තර ගනු ලැබූවද ඝාතනය ගැන වැදගත් කිසිම තොරතුරක් ඔවුනගෙන් පොලීසියට ලැබුණේ නැත.ඔවු තිදෙනාම පවසා සිටියේ මේ ගැන කිසිම දෙයක් ඔවුන් නොදන්නා බවය.පොලීසිය ඔවුන් විශ්වාස නොකළ නමුත් ඝාතනයේ ඉදිරි පරීක්ෂන කටයුතු නොකඩවා සිදු කරන්නට ඔවුහු තීරණය කළහ. ඉන්පසුව ඔව්හු සැකාරුවන් තිදෙනාගේම නිවෙස් දැඩි පරීක්ෂාවකට භාජනය කළහ.ජයවධනගේ නිවෙස පරීක්ෂා කිරීමේදී ඔවුන් මෙතෙක් කල් සොයමින් සිටි ආයුධය සොයා ගැනීමට පොලීසියට හැකිවිය. ඔහුගේ නිවස දැඩි පරීක්ෂාවකට ලක් කෙරුනු අතර එහි මුළුතැන් ගෙයි අටුවේ සඟවා තිබූ මල් පිහිය සොයා

ගැනීමට ඔවුනට හැකි විය. පිහිය ඉතාමත් දැඩි පරීක්ෂාවට ලක් කෙරුනු නමුදු එහි ඔවුන් බලාපොරොත්තු වූ පරිදි ලේ පැල්ලම් හෝ වෙනත් කිසිම සළකුණක් දැක ගැනීමට පොලීසියට හැකිවූයේ නැත. කෙසේ වෙතත් එහි අනෙකුත් භෞතික ලක්ෂණ සියල්ලම වාගේ සේනපාල දුන් විස්තරයට අනුකූල වූ අතර මහාචාර්ය රණසිංහ විසින් අනුමාන කරන ලද ලක්ෂණ සියල්ලම සමඟද සසැඳිණි.

මෙහිදී නඩු කටයුතු සඳහා අවශ්‍යවන තවත් දෙයක් වේ. එනම් ඝාතකයන් තුළ සෝමලතාව මරාදැමීම සඳහා චේතනාවක් වූවාදැයි යන කරුණයි. එසේම මෙය සැළසුම් සහගතව සිදුකරන ලද්දක්දැයි යන කරුණද සැකකරුවන්ට එරෙහිව ඇති මිනීමැරුම් චෝදනාව ඔප්පු කිරීම සඳහා වැදගත් වේ.

මෙහිදී ප්‍රශ්න සහගත කරුණු කිහිපයක් මතු විය හැක. පළමුව ජූනි 25වනදා සවස සෝමලතා පා ගමනින් මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා පා ගමනින් යන්නට පිටත් වන්නේ ඇයට මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා යන බසය මඟහැරුනු නිසාය. එනම් මෙය අහඹු සිද්ධියකි. එසේනම් ඝාතකයින්ට සෝමලතාව මුණගැසීමත් අහඹු සිද්ධියක් විය යුතුය. එහෙත් මෙහිදී පැන නගින තවත් ප්‍රශ්න කිහිපයක් වේ. එනම් මෙම හමුවීම අහඹු සිද්ධියක් නම් තිදෙනෙකු එහි සිටීම සිදුවූයේද අහම්බයෙන්ද? එසේම ඔවුන් අත මල් කපන පිහියක් වූයේ කෙසේද? එය රැගෙන ආවේ කුමන හේතුවක් නිසාද? නැතිනම් ඔවුන් තිදෙන සැළසුම් කළ පරිදි මග රැක සිටියාද?

සෝමලතා එදින පා ගමනින් තිස්මඩ යනට පැමිණියේ අහම්බයෙන් නිසා එසේ සැළසුම් කර මග රැක සිටීම අනුවන ක්‍රියාවකි. මේ කරුණු කෙසේ වූවත් මේ සිද්ධිය ගැන විමසන ඕනෑම කෙනෙකුට මෙය හිතා මතා සැළසුම් සහගතව කරන ලද ඝාතනයක් බව මෙනී යනවා නොඅනුමානය.

1971 වසර යනු තිස්මඩ හෝ මැණික්දිවෙල යන ග්‍රාම දෙකම එතරම් ජනාකීර්ණ නොවූ කාලයක් විය. එම මාර්ගයේ ගමන් ගන්නා වාහන සංඛ්‍යාවද ඉතාමත් අවම විය. තිස්මඩ ග්‍රාමයේ

වාහන භාවිතා කළ කිසිවෙකුත් නොවුනු බව අනුමාන කල හැක. මෙහිදී පොලීසියේ ඇස නොගැටුනු යම් කිසිවක් ඇත්දැයි මට සිතේ.

මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා යන බසයට නුවර සිට බස්යෙන් මැණික්දිවෙල දක්වා එන සමහරුන් ගොඩවීම සාමාන්‍යය සිද්ධියකි. එසේම 1971 වසරේ මැණික්දිවෙල සවස් කාලය එතරම් සෝෂාකාරී වේලාවක්ද නොවේ. එසේනම් මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා යන බසයේ රියදුරුට නුවර සිට ආ බසය නොපෙනුනේ හෝ එහි නළා ශබ්දය නොඇසුනේ ඇයි? සෝමලතා එහි තනිකර යෑම රියදුරු සිතා මතා සිදු කළ දෙයක් විය හැකිද? නැත්නම් වෙනත් කෙනෙකුගේ අනුදැනුම හෝ උපදෙස් මත සිදුවූවාද? ඝාතකයින් තිදෙනාගෙන් කිසිවෙකු හෝ බසය තුළ සිටියාද? මගේ අදහස අනුව එසේ වීමේ විශාල ප්‍රවණතාවයක් ඇත. එසේ නම් මේ තිදෙනාගෙන් අයෙකු බසය තුල සිට අතරමගදී බැස්සාද යන්න විමසිය යුතුව තිබිණි. බසයේ රිසදුරු ගෙන් මේ ගැන ප්‍රශ්න කළා නම් හොඳයැයි මට සිතේ. එකල තිබූ වාතාවරණය අනුව මිනීමැරුමක් ගැන තොරතුරු දන්නා කෙනෙකු ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත් වී සාක්ෂි ලබාදෙයැයි සිතිය නොහැක. මගේ සිතුවිළි අනුව සෝමලතාව ග්‍රහණයට ගැනීම මෙසේ වූවා විය හැක.

මෙම ඝාතකයින් තිදෙනාටම සෝමලතාට හෝ ඇයගේ පවුලේ කෙනෙකුට හිරිහැරයක් කිරීමට අවශ්‍යව තිබුණි. එහෙත් තිස්මඩ ග්‍රාමය තුළ එසේ කිරීමේ හැකියාව අඩු නිසා පහසු වන්නේ ගමෙන් පිටතදී එසේ කිරීමයි. සෝමලතා දිනපතා රැකියාවට යන එන නිසා පහසු වන්නේ ඇයව අල්වා ගැනීම බව ඕනෑම කෙනෙකුට වැටහේ. ටික කාලයක් ඇගේ ගමන් රටාව නිරීක්ෂණය කළහොත් මේ ක්‍රියාව අපහසු වන්නේ නැත. නුවර සිට කෙළින්ම තිස්මඩ දක්වා ධාවනයවන බසයෙන් පැමිණියහොත් සවස 4.15 පමණ වන විට සෝමලතා නිවසට පැමිණේ. එසේ නැතුව මැණික්දිවෙලට පැමිණ එහි සිට තිස්මඩ බසයෙන් පැමිණෙන්නේ නම් ඇය නිවසට පැමිණෙන

විට සවස 5.30 පමණ වේ. මෙය නිරීක්ෂණය කරන්නෙකුට එසේ සෝමලතා ප්‍රමාදවන බව දැනගතහොත් තිස්මඩ සිට මැණික්දිවෙල දක්වා කෙටි වේලාවකින් යා හැකිය. එසේනම් දෙදෙනෙකුට මග සැඟවී ඉන්නට කිය එක අයෙකුට මැණික්දිවෙල රැඳී සිටීමට හැක. කිසිවෙකු ඒ ගැන ීඅකයක් සිතන්නේද නැත. එසේ කොට කිසියම් ක්‍රමයකින් තිස්මඩ බසයේ රියදුරුව පොළඹවාගෙන සෝමලතා මැණික්දිවෙල දමා අවහොත් ඊළඟ බසය එනතුරු රැඳී නොසිට සෝමලත පාගමනින් තිස්මඩ් දක්වා ඇති සැතපුම් 1 1/4 දුර ඒම පුදුමයක් නොවේ. එසේ බසයෙන් එන තැනැත්තා අතරමගදී කිසියම් හේතුවකට බසයෙන් බැස්සහොත් ඒ ගැන වුවද කිසිවෙකු සැක කරන්නේ නැත. මේ සිද්ධි දාමය මෙසේ හෝ මීට සමාන ආකාරයකින් සිදුවුවහොත් සෝමලතාව ග්‍රහණයට ගැනීමේ ක්‍රියාව පහසුවෙන් සිදුකල හැක. මගේ අදහස නම් තිස්මඩ බසයේ රියදුරුගෙන් ප්‍රශ්න කළේනම් මෙම ඝාතනයට සම්බන්ධ තවත් වැදගත් කරුණු රාශියක් දැන ගත හැකිවනු බවයි.

# 7. දඬුවම

සෝමලතාගේ ඝාතනය පිළිබඳ ලසු නොවන නඩු විභාගය පැවැත්වුනේ මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේදීය. එහිදී රිචර්ඩ්, ජයවර්ධන සහ ප්‍රේමදාස යන තිදෙනාට අමතරව තිස්මඩ උප තැපැල් හලේ තැපැල් ස්ථානාධිපති වු ඩබ්. ඩී. කුලසිංහ යන අයටද විරුද්ධව චෝදනා ගොනු කෙරුනු අතර පසුව පොලීසිය විසින් ඔහුට විරුද්ධව නගා තිබූ චෝදනා ඉල්ලා අස් කරගනු ලැබීය. ඔහුට විරුද්ධව චෝදනා ගොනු කිරීමට පොලීසිය කටයුතු කළේ ඔහුද අල්විස් වෙද මහතා සමඟ යම් අමනාපයකින් පසුවූ නිසාය. එහෙත් එම සැකය සාධාරනීකරණය කිරීමට අවශ්‍ය වෙනත් කිසිම සාක්ෂියක් ඔවුන් වෙත නොතිබිණි. එබැවින් නඩුවේ මූලික අවස්ථාවේදීම කුලසිංහ නිදහස් කරනු ලැබීය.

1972 නොවැම්බර් මස 28 වනදා මහනුවර මහාධිකරණයේදී සෝමලතා ඝාතන නඩු විභාගය ඇරඹිනි. විනිසුරු සිරිමාන්න සහ ඉංග්‍රීසි කථා කරන ජූරි සභාවක් හමුවේ නඩු විනිශ්චය පැවතිනි. රජය වෙනුවෙන් නීතිඥ සිසිල් ගුනවර්ධන පෙනී සිටි අතර විත්ති කරුවන් වෙනුවෙන් නීතිඥ ඒ. සී. ද සොයිසා සහ විජය වික්‍රමරත්න පෙනී සිටියහ. පැමිණිල්ලේ ප්‍රධාන සාක්ෂොකරු වූයේ සේනපාලයි. ඝාතනය ඇසින් දුටු සාක්ෂිකරුවකුවූ බැවින් එය ඉතාමත් වැදගත් සාක්ෂියක් විය. විත්තියේ නීතිඥයින් ඔහුගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්ණ අසන ලදී. සේනපාල බොරු සාක්ෂි දෙන බව ඔවුන්ගේ අදහවූ අතර එය බිඳලීම සඳහාදිගින් දිගට හරස් ප්‍රශ්න අසන නමුදු සේනපාල්ගේ සාක්ෂිය බිඳීමට ඔවුන් සමත් වූයේ නැත. සේනපාල්තමන් සත්‍ය වශයෙන්ම දුටු දේ ඒලෙසම පවසා සිටීම නිසා ඔවුන්ගේ තැත ව්‍යර්ත විය. දින කිහිපයල් නඩු ඇසීමෙන් පසු අවසානයේදී තීන්දුව ලබාදෙන දිනය උදාවිය. මිනිත්තු හැට පහක කාලයක් ගත කිරීමෙන් පසු ජූරි සභාව ඒක මතික තීරණයකට පැමිනි අතර ජූරි සභාවේ සභාපති

වරයා විසින් විනිශ්චකාරතුමාට දන්වා සිටියේ ජූරි සභාවේ ඒකමතික තීරණය අනුව විත්තිකරුවන් තිදෙනාම වරදකරුවන් බවය. ජූරි සභාවේ තීරණය අනුව විනිසුරුවරයා විසින් විත්ති කරුවන් තිදෙනාටම මරණ දණ්ඩනය පනවන ලදී.

මරණීය දණ්ඩණය නියමවූ තිදෙනා මහාධිකරණ තීන්දුවට විරුද්ධව අභියාචනයක් ගොනු කළ අතරය 1973 ජූලි මස අපරාධ අභියාචනාධිකරණයේදී විභාගයට ගන්නා ලදී. අග්‍ර විනිශ්චය කාර තුමා වූ එච්. එන්.ජී. ප්‍රනාන්දු මැතිතුමා, විනිශ්චයකාර අලස් සහ තමෝදරන් යන ත්‍රිපුද්ගල විනිසුරුමඬුල්ල හමුවේ විභග කෙරුණු නඩුවේ තීන්දුව 1973 ජූලි මස 25 වනදා ප්‍රකාශයට පත් කරන ලද අතර එමඟින් අභියාචනාකරුවන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

මරණීය දණ්ඩණය නියමවූ තිදෙනා මහාධිකරණ තීන්දුවට විරුද්ධව අභියාචනයක් ගොනු කළ අතරය 1973 ජූලි මස අපරාධ අභියාචනාධිකරණයේදී විභාගයට ගන්නා ලදී. අග්‍ර විනිශ්චය කාර තුමා වූ එච්. එන්.ජී. ප්‍රනාන්දු මැතිතුමා, විනිශ්චයකාර අලස් සහ තමෝදරන් යන ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල හමුවේ විභග කෙරුණු නඩුවේ තීන්දුව 1973 ජූලි මස 25 වනදා ප්‍රකාශයට පත් කරන ලද අතර එමඟින් අභියාචනාකරුවන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වෙතත් මෙම තීරණය තුනෙන් දෙකක බහුතරයකින් ලැබුණු තීරණයක් විය. විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ මෙහිදී අග විනිසුරු ප්‍රනාන්දු මැතිතුමාගේ තීරණය වූයේ ප්‍රේමදාස මිනීමැරුම් චෝදනාවෙන් නිදහස් කළ යුතු බවයි.ඔහු පවසා සිටියේ ප්‍රේමදාස හට සෝමලතා මරාදැමීමේ චේතනාවක් තිබුණේදැයි සැක සහිත බවය.

අපරාධ අභියාචනාධිකරණයේ තීන්දුවට විරුද්ධව නැවතත් ඉහළ අභියාචනාධිකරණයට යොමු විය. නමුත් එම අභියාචනය සළකා බැලීමට ලංකාවේ අධිකරණ පද්ධතියේ වෙනසක් ඇතිවූ අතර ඉන් ඉහළ අභියාචනාධිකරණය අහෝසි විය. පසුව පිහිටවූ ශ්‍රේෂ්ඨාධිකරණයේදී පස් දෙනෙකුගෙන් යුත් විනිසුරු

මඬියල්ලක් හමුවේ මෙම අභියාචනය සළකා බලන ලදී. එහි තීන්දුව අනුව පහෙන් තුනක බහුතරයකින් ප්‍රේමදාසව මිනිමැරුම් චෝදනාවෙන් නිදහස් කරන ලදී.

ප්‍රේමදාස යන අයව මිනීමැරුම් චෝදනාවෙන් නිදහස් කිරීම පිළිබඳව පක්ෂව සහ විපක්ෂව විවිධ මත ඉදිරිපත් විය. තවමත් එම තීරණය විවාදයට හේතුවන කරුණක් වේ. කෙසේ වෙතත් එය නීති රාමුව තුල විනිසරුවරුන්ගේ පෞද්ගලික අදහස් හා මත අනුව එළැඹුනු තීරණයක් බැවින් ඒ ගැන මීට වඩ සඳහන් කිරීමට අවශ්‍ය නැතැයි මම සිතමි.කෙසේ වෙතත් රිචර්ඩ් සහ ජයවර්ධන යන අයවළුන්ට උපරිම දඬුවම හෙවත් මරණීය දණ්ඩනය ලැබිණි. එහෙත් අහිංසක උගත් රටට මහත් වැඩදායක පුරවැසියෙක් වන්නට තිබූ සෝමලතා වැන්නියකගේ මරණය එය සිදු කළ ඝාතකයින්ට දඬුවම් දුන් පමණින් කිසිදාක පියවනු හැකිවේද?